# නොදුටු සටන

## ශ්‍රී ලංකාවේ ජීවත්වන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව පිළිබඳ තත්ත්ව විශ්ලේෂණය

මෙම වාර්තාව සකස් කරන ලද්දේ නවසීලන්ත මහකොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු ව්‍යාපෘති ආධාර යටතේ සිදු කරන ලද අධ්‍යයනයක සහභාගී වූවන් ලබා දුන් තොරතුරු මත පදනම්ව ය. මෙහි අන්තර්ගතයට හෝ තොරතුරුවලට නවසීලන්ත මහකොමසාරිස් කාර්යාලයේ සම්බන්ධයක් නොමැති බව සලකන්න.

සැකසුවේ වත්සලා හේරත් විසිනි.

**ඉක්විටි ශ්‍රී ලංකා ප්‍රකාශනයකි.**



© 2023 **Équité Sri Lanka**

# පටුන

විධායක සාරාංශය.......... 3

පාරිභාෂිත පදමාලාව.......... 4

ක්‍රමවේදය .......... 5

අනන්‍යතාවය සොයාගැනීමේ අරගලය .......... 7

ආධිපත්‍යවාදී පුරුෂභාවයේ බලපෑම .......... 8

සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවය සමග ජීවත්වීම .......... 10

නීතිමය සහ ප්‍රතිපත්ති පසුබිම.......... 12

වෙනස්කොට සැලකීම සහ කොන්කිරීම.......... 14

සියල්ල පටන්ගන්නේ “පවුලෙනි”.......... 15

සෘණාත්මක බැල්මක් යටතේ ජීවත්වීම.......... 17

ආගමික බලපෑම.......... 19

අධ්‍යාපනික පසුබිම .......... 21

රැකියා නියුක්තිය .......... 23

සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව.......... 25

නිර්දේශ .......... 28



© 2023 **Équité Sri Lanka**

# විධායක සාරාංශය

ලෝකයේ විවිධ ප්‍රදේශවල ජීවත් වන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් මුහුණපාන, ඔවුන්ට විශේෂ වූ අභියෝගවලට අවධානයක් ලබාදෙමින්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ අයිතීන් සහ ඔවුන්ව වෙන් නොකොට පිළිගැනීම පිලිබඳ ගෝලීය සංවාදයට පසුගිය අවුරුදු කිහිපය තුළදී සැලකිය යුතු ප්‍රමුඛත්වයක් ලැබී ඇත. ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ  අයිතීන් පිළිබඳ ව්‍යාපාරයද නීතිමය හඳුනාගැනීම සහ ඔවුන්ගේ අනන්‍යතාව පිළිගැනීම  පසුගිය වසරවලදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. කෙසේ නමුත්, ඔවුන් මුහුණපාන අභියෝග දිගින් දිගටම පවතින අතර, ඒවා බහුවිධ වේ. ඒවා ඔවුන්ගේ ජීවිතවල සමාජ, නීතිමය, සෞඛ්‍ය සහ ආර්ථික අංශ සමග බද්ධව පවතී.

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලන්ගේ අයිතීන් පිලිබඳ ගෝලීය ව්‍යාපාරය තුළ, සංක්‍රාන්ති සමාජභාවී කාන්තා ප්‍රජාව සමග සංසන්දනය කළ විට සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව සම්බන්ධ පිළිගැනීම, හඳුනා ගැනීම සහ ඔවුන්ගේ නියෝජනය අඩු මට්ටමක පවතින බව පෙනී යයි. ශ්‍රී ලංකාවට මෙම සංසිද්ධියෙන් ගැලවී සිටිය නොහැක. සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව තමන් “සංක්‍රාන්ති සමාජභාවී පිරිමි” ලෙස හඳුන්වාගැනීමට මැලිකමක් දක්වන බව දක්නට ඇත. ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාව වෙනුවෙන් නිර්මාණය වී ඇති පොදු වේදිකාවල ඔවුන්ගේ සහභාගීත්වය සම්බන්ධයෙන්ද මේ තත්ත්වය දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ LGBTIQ+ ව්‍යාපාරය තුළ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව සම්බන්ධයෙන් හිඩැසක් නිර්මාණය කිරීමට මෙම තත්ත්වය විශාල ලෙස දායක වී ඇත.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික, සමාජයීය සහ නීතිමය රාමුව තුළ මුල්බැසගත් විශේෂිත වූ ගැටළු සහ අභියෝග ගණනාවකටද සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් මුහුණපායි. සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව මුහුණපාන ගැටළු සම්බන්ධ දැනුවත්භාවය සහ අවබෝධය මදිකමක් ඇති අතර, එය, පුළුල්ව ව්‍යාප්තව ඇති වෙනස්කොට සැලකීම් සහ ආන්තිකකරණය ලක්කිරීම් වලට මග පාදා ඇත. නීතිය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අංශ තුළ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව වෙන් නොකොට පිළිගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති හඳුන්වාදීම අතින් විශාල ප්‍රගතියක් ඇති මුත්, මේ පුද්ගලයින්ට එරෙහි වෙනස්කොට සැලකීම තවමත් ව්‍යාප්තව පවතී. බොහෝ අවස්ථාවලදී, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්, සෞඛ්‍ය සේවාවන් නිසි ලෙස සැපයීමට ප්‍රමාණවත් සූදානමක් නොමැති වෛද්‍ය වෘත්තිකයින්ගෙන් එල්ලවන ප්‍රතිරෝධයට මුහුණපාන අතර, ඒ හේතුවෙන්, මෙම ප්‍රජාවට සෞඛ්‍ය සේවා ලබාගැනීම දැඩි අභියෝගයකි. තවද, සමාජභාවී අනන්‍යතාවයට පිළිගැනීමක් ලබාදීමට සහ වෙනස්කොට සැලකීම්වලට විරුද්ධව නීති ඇතිකිරීමට පැහැදිලි නීතිමය රාමුවක් නොමැති පසුබිමක, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සම්බන්ධයෙන් පවතින නීතිමය පිළිගැනීම සහ ආරක්ෂාව ප්‍රමාණවත් මට්ටමක නොමැත. මේ තත්ත්වය පවුල සහ සාමාන්‍ය සමාජය තුළ විවිධාකාරයේ හිංසන සහ වෙන්කොට සැලකීම්වලට ලක්විය හැකි අනතුරුදායක තත්වයකට සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව පත් කරයි. තවද, රැකියාව සම්බන්ධ වෙනස්කොට සැලකීම් සහ සීමාසහිත අධ්‍යාපනික අවස්ථා තවදුරටත් ඔවුන්ගේ සමාජ-ආර්ථික සංවර්ධනයට බාධා කරයි.

මෙම විශේෂිත වූ ගැටළුවලට විසඳුම් සෙවීමට නම්, ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවට වෙනස්කොට සැලකීමෙන් සහ අවිචාරී විනිශ්චයෙන් තොර තෘප්තිමත් ජීවිත ගතකිරීමට ඇති ඉඩකඩ තහවුරු කිරීමේ අරමුණ ඇතිව, දැනුවත්භාවය වැඩිකිරීම, සෞඛ්‍ය සේවා පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, සහ පුළුල් නීතිමය රැකවරණ බලාත්මක කිරීම වෙනුවෙන් ඒකාබද්ධ ප්‍රයත්නයන් අවශ්‍ය වේ.


© 2023 **Équité Sri Lanka**

# පාරිභාෂිත පදමාලාව

බයින්ඩර්ස්: පියයුරු පැතලිව පෙනෙන ආකාරයට තද කරගැනීම සඳහා පපුව වටා ඔතාගන්නා තද, රෙදිවලින් සකසා ඇති ඇඳුමක් හෝ රෙදි පටියකි.

ජී.ආර්.සී.: සමාජභාවී අනන්‍යතාවය හඳුනාගැනීමේ සහතිකය (Gender Recognition Certificate - GRC)

සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ සැත්කම්: ලිංගිකත්වය නැවත සැකසීමේ සැත්කම යනු, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුගේ ලිංගික සහ ප්‍රජනන අවයව ඇතුළු ශාරීරික ලක්ෂණ ඔවුන් තමන්ව හඳුනාගන්නා අනන්‍යතාවයට ගැලපෙන අයුරින් වෙනස් කරන සැත්කම් ආශ්‍රිත ක්‍රියාවලීන් කිහිපයක එකතුවකි.

විෂමරිසි (පුද්ගලයින්): ලිංගිකව, ආදරය සම්බන්ධයෙන් සහ චිත්තවේගීයව විරුද්ධ ලිංගයේ පුද්ගලයින්ට ආකර්ෂණය වන පුද්ගලයින්.

අයි.එල්.ඕ.: ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labor Organization – ILO)

එල්.ජී.බී.ටී.අයි.ක්‍යූ.+: සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, තමන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවීය අනන්‍යතාව හඳුනාගෙන නොමැති පුද්ගලයින්, අන්තර්ලිංගික සහ වෙනත් අනන්‍යතා (Lesbian, Gay, Bisexual, Trans, Queer/Questioning, Intersex and Other – LGBTIQ+)

එන්.අයි.සී.: ජාතික හැඳුනුම්පත (National Identity Card – NIC)

සංක්‍රාන්ති සමාජභාවී: උපතේදී පවරා දුන් ලිංගිකත්වයට විරුද්ධ හෝ වෙනස් සමාජභාවීය අනන්‍යතාවන් දරන පුද්ගලයින්

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි: උපතේදී කාන්තා ලෙස ලිංගිකත්වය පවරා දුන් නමුත්, මානසිකව තමන් පුරුෂයෙකු ලෙස හඳුනාගන්නා සහ එලෙස පෙනී සිටීමට කැමති පුද්ගලයින්.

සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව: සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් සම්බන්ධයෙන් අති නොදැනුවත්භාවය මත පදනම්ව බියට පත්වීම, අප්‍රසාදය හෝ වෛරය

'ටොප් සර්ජරි': සිංහලෙන් '(ශරීරයේ) ඉහළ කොටසේ කරන සැත්කම' යන අරුත දෙන මෙම සැත්කම් පපු ප්‍රදේශයේ පියයුරු ඉවත් කිරීමට සිදුකරන සැත්කම් ලෙසින්ද හැඳින්වේ. මේ සැත්කම් යටතේ, ශල්‍යකර්ම හරහා පියයුරු පටක හැඩගැස්වීම හෝ පියයුරු ඉවත් කිරීම සිදුවේ.

සෝජී-එස්.සී.: ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය/ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (sexual orientation, gender identity, gender expression and sex characteristics - SOGIESC)

යූ.පී.ආර්.: එක්සත් ජාතීන්ගේ විශ්ව කාලාන්තර සමාලෝචනය (Universal Periodic Review – UPR)



© 2023 **Équité Sri Lanka**

# ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේදී පහත සඳහන් ක්‍රමවේදය උපයෝගී කරගන්නා ලදී.

දත්ත එක්රැස් කරගැනීම: මීට අදාළ අධ්‍යනයට සහභාගී වූ සියලුම දෙනා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් ලෙස හඳුනාගන්න ලදී. දත්ත එක්රැස්කරගැනීම ක්‍රම දෙකකට සිදුවිය. එනම්, අන්තර්ජාලය ආශ්‍රයෙන් Online සමීක්ෂණයක් සිදුකිරීම සහ රටේ විවිධ ප්‍රදේශවලින් සහභාගී වූ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජා සාමාජිකයින් 169කගේ සහභාගීත්වය ඇතිව ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම යි. සමීක්ෂණය දිවයින පුරා විහිදුනු එකක් වන අතර, ඊට ලැබුණු ප්‍රතිචාර ගණන 144 කි. එසේම, මධ්‍යම, නැගෙනහිර, උතුරු, වයඹ, උතුරුමැද, දකුණු, සබරගමුව සහ බස්නාහිර පළාත් නියෝජනය කළ සහභාගීවන්නන් 25ක් සමග පැවැත්වූ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ගණන 5 කි. මෙම වාර්තාව හරහා සිය දත්ත බෙදාගැනීම සඳහා සහභාගී වූවන් කැමැත්ත පළකරන ගිවිසුමකටද ඇතුළත් විය. සහභාගීවූවන්ගේ අනන්‍යතාවයේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා මෙම වාර්තාවේ අඩංගු සිද්ධීන් සහ ප්‍රකාශ අන්වර්ථ නාමයක්/තෝරාගත් නාමයක් යටතේ පළකර ඇත.

පරාමිතීන්: මෙය සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවගේ තත්වය විශ්ලේෂණය කිරීම අරමුණු කොටගත් නියමු ව්‍යාපෘතියක් වීම නිසා මේ හරහා ප්‍රධාන වශයෙන්ම අවධානය යොමුකළේ ඔවුන් විසින් මුහුණපාන ඔවුන්ට විශේෂිත වූ ගැටළු සහ අභියෝග අවබෝධ කරගැනීමටයි. සමීක්ෂණයට සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට භාවිත කළ ප්‍රශ්නාවල සකසනු ලැබුවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවට බලපාන දේශපාලනික සහ සමාජ-ආර්ථික තත්වයන් වටහාගැනීමේ අරමුණ ඇතිවයි. මෙය නියමු ව්‍යාපෘතියක් වීම හේතුවෙන් සහභාගීවූවන්ට සිය අත්දැකීම් බෙදාගැනීමේදී ඊට අදාළ කාලය සම්බන්ධ සීමා පැනවා තිබුණේ නැත.

ඉදිරිපත් කිරීම: මෙම වාර්තාව සකසා ඇත්තේ සිද්ධීන් මත පදනම් වූ සවිස්තරාත්මක වාර්තාවක් ලෙසිනි. වාර්තාව තුළ භාවිතා කර ඇති කෙටි යෙදුම් පාරිභාෂිත පදමාලාව යටතේ සඳහන් කර ඇත.


© 2023 **Équité Sri Lanka**

# සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයකුගේ අනන්‍යතාවය

අනන්‍යතාවය යනු මානව පැවැත්මේ මූලිකම අංගයක් වන අතර, එය පුද්ගලයින් තමන්ව හඳුනාගන්නා අකාරය සහ ඔවුන් වටා පවතින ලෝකය සමග කටයුතු කරන ආකාරයද හැඩගස්වයි. ලෝකයේ බොහෝ ප්‍රදේශවල මෙන් ශ්‍රී ලංකාවේද සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකුගේ අනන්‍යතාවය සොයායාම යනු විවිධ වූ සංස්කෘතික, සමාජයීය සහ පෞද්ගලික සාධක ගණනාවකින් හැඩගැස්වී ඇති සංකීර්ණ සහ අංශ ගණනාවකින් යුත් ගමනකි. ස්ව අනන්‍යතාවය හඳුනාගැනීම සහ පිළිගැනීම යනු ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයකුට තමන්ව පූර්ණ ලෙස වටහාගන්නේ හෝ පිළිගන්නේ නොමැති සමාජයක් තුළ ගනුදෙනු කිරීමට සිදුවන ක්‍රියාවලියකි. ඔවුන් සිය පවුල්වලින් මෙන්ම ප්‍රජාවන්ගෙන් ද වෙනස්කොට සැලකීම්වලට සහ කොන්කිරීම්වලට ලක්වන අතර, එවැනි සැලකීම් හේතුවෙන් ඔවුන් තනිවීම සහ මානසික පීඩනයට පත්වීම සිදු වේ. සාම්ප්‍රදායික සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධ සම්මතයන් සමාජයේ ගැඹුරු ලෙස මුල් බැසගෙන ඇති ශ්‍රී ලංකාව තුළ ස්ව අනන්‍යතාවය පිළිගැනීමේ ගමන අභියෝගාත්මක එකක් විය හැකිය.



© 2023 **Équité Sri Lanka**

# අනන්‍යතාවය සොයාගැනීමේ අරගලය

“අවංකවම කියනවනම් මගේ අනන්‍යතාවය අඳුනගන්න මට ගොඩක් කල් ගියා. මම හැමතිස්සෙම ගැහැණුන්ට කැමැත්තක් දක්වපු නිසා මම මුලින් හිතුවෙ මම සමරිසි කාන්තාවක් කියල. මට ගොඩක් කල් ගියා මම මාව පිරිමියෙක් විදියට අඳුනගන්නව කියන දේ තේරුම් ගන්න. ගැහැණියෙක් පිරිමි ඇඳුම් අඳින එකට වඩා අපේ සමාජය පිරිමියෙක් ගැහැණු ඇඳුම් අඳින එක පහත් කරල සලකනව. ඒවගේම මම දැනන් හිටියෙ නෑ ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ඉන්නව කියල. මම සංක්‍රාන්ති සමාජභාවී ගැහැණු දැකල තියෙනවා. නමුත් මට ලොකු කාලයක් ගියා මගේ ප්‍රජාව හොයාගන්න සහ ඒ අයත් එක්ක සම්බන්ධ වෙන්න.”

- *සුධීර (අවු. 35 යි, රාජගිරියේ සිට)*

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයකුගේ ජීවවිද්‍යාත්මක ශරීරයට ඔවුන්ගේ අනන්‍යතාවය හැඩගැස්වීමේදී සංකීර්ණ සහ අත්‍යාවශ්‍ය භූමිකාවක් ඇත. ඔවුන් සිය සමාජභාවී අනන්‍යතාවය වටහාගන්නා මොහොතේ සිට, බොහෝවිට කුඩා වයසකදීම, තමන්ගේ අනන්‍යතාවය පිලිබඳ ඇති අභ්‍යන්තර වටහා ගැනීම සහ උපතේදී බාහිර ලක්ෂණ මත තීරණය කරනු ලැබූ අනන්‍යතාවය අතර ඇති නොගැලපීම සමග ඔවුන් පොර බදයි. මෙම නොගැලපීම ලිංගිකත්වය පිළිබඳ බලවත් කනස්සල්ලක්, දැඩි අපහසුතාවයක් හෝ පීඩාවක් ඇති කරයි. මේ හේතුවෙන්, බොහෝ අවස්ථාවලදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් සිය ජීවවිද්‍යාත්මක ශරීරයට සම්බන්ධ සහ අතිශය පෞද්ගලික තමන්ව හඳුනාගැනීමේ සහ පිළිගැනීමේ ගමනක නියැලී සිටී.

“මම දන්නව හැමතිස්සෙම බයින්ඩර් එකක් ඇඳගෙන ඉන්න එක හොඳ නැහැ කියල. නමුත් මට එක නොකර ඉන්න බැහැ. මම මගේ ශරීරයට වෛර කරනව, විශේෂයෙන්ම මගේ ඇගේ උඩ කොටසට. බයින්ඩර් එක ඇඳගෙන ඉන්න එකෙන් ඇතිවෙන වේදනාව නිසා මගේ ඇඟට තවත් වෛර කරනවා. සමහර වෙලාවට මගේ සහකරුවා/සහකාරියගේ ශරීරය නිසා මට මගේ ශරීර කොටස් ගැනත් වෛරයක් ඇතිවෙනවා.”

- *විවේක් (අවු. 29 යි, කැළණියේ සිට)*

සහභාගී වූවන් සඳහන් කළ ආකාරයට, පියයුරු සහ ස්ත්‍රීභාවී ශරීර ලක්ෂණ වැනි ජීවවිද්‍යාත්මකව කාන්තා ශරීරයට අදාළ ලක්ෂණ ලිංගිකත්වය පිලිබඳ කනස්සල්ලක් සහ අන්‍යයන්ගෙන් වෙන්කර සැලකීම සම්බන්ධ හැඟීමක් ඇති කළ හැකිය. තවද, මේ හැඟීම් පුද්ගලයකුට තමාගේ ශරීරයෙන් වෙන්වී සිටීමක් වැනි හැඟීමක් ඇති කළ හැකි අතර, විශාදය සහ කාංසාව වැනි මානසික සෞඛ්‍ය සම්බන්ධ අභියෝගවල එල්ල කිරීමට ඉඩ තිබේ.
සහභාගීවූවන් තවදුරටත් පැවසුවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයකුගේ ජීවවිද්‍යාත්මක ශරීරය පිළිබඳ සමාජයේ දැක්ම ඔවුන්ගේ අනන්‍යතාවය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන බවයි. මෙම තත්වය ප්‍රධාන වශයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව අතර සමාජය විසින් පවත්වාගෙන යන ඒකාකෘති සමාජභාවී අනන්‍යතා භූමිකාවලට අනුගතවීමේ නිරන්තර අවශ්‍යතාවයක් නිර්මාණය කිරීමට හේතු වේ.


© 2023 **Équité Sri Lanka**

# ආධිපත්‍යවාදී පුරුෂභාවයේ බලපෑම

අහිතකර පුරුෂභාවය යනු සාම්ප්‍රදායික පුරුෂ ඒකාකෘති ශක්තිමත් කරන, බොහෝ අවස්ථාවලදී හානිකර හැසිරීම් සහ ආකල්ප ප්‍රවර්ධනය කරන, සංස්කෘතික සම්මතයන් සහ අපේක්ෂාවන් සමූහයකි. මෙම සංකල්පය පිරිමින්ට නිශ්චිත හැසිරීම්, හැඟීම් සහ ලක්ෂණ නියම කරන සාම්ප්‍රදායික සමාජභාවී අනන්‍යතා භූමිකා තුළ මුල්බැසගෙන ඇත. මෙම සම්මතයන් බොහෝ අවස්ථාවලදී ස්ටෝයිකවාදය, චිත්තවේගීය යටපත්කිරීම, ආධිපත්‍ය සහ චණ්ඩභාවයට වැඩි අවධාරණයක් ලබාදෙන අතර, අනාරක්ෂිත බව, සංවේදනය සහ කෝපය හැර අනෙකුත් හැඟීම් ප්‍රකාශ කිරීම අධෛර්යමත් කරයි. මෙය මෑත අවුරුදු කිහිපය තුළ විශාල අවධානයක් ලබාගත් සංසිද්ධියක් වනවා සේම, පුද්ගලයින් සහ සමස්තයක් ලෙස ගත්කල සමාජය මත එහි බලපෑම පිළිබඳව සාකච්ඡාවන් ද ඇතිකර ඇත.

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව සැලකිල්ලට ගත්විට, අහිතකර පුරුෂභාවය කෙරෙහි ඇති නැඹුරුතා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ අත්දැකීම් සමග ඔවුන්ට විශේෂිත වූ ආකාරවලින් සම්බන්ධ විය හැකි බව පැහැදිලි වේ. සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ අත්දැකීම්, සමාජභාවී අනන්‍යතා සහ සමාජයීය අපේක්ෂාවන් සම්බන්ධවීමෙන් හැඩගැස්වී ඇති නිසා, ඊට අහිතකර පුරුෂභාවය සම්බන්ධ නැඹුරුතාද ඇතුළත් විය හැකිය.

"මම මගේ සංක්‍රාන්ති ක්‍රියාවලිය ඉවර කරල, කසාදත් බැඳලයි ඉන්නෙ. නමුත් තාමත් මට මගේ පෙනුම ගැන ආත්ම විශ්වාසයක් නැහැ. සමහර වෙලාවට කන්නාඩියෙන් මගේ දිහා බලද්දි මට තාමත් කම්පනයක් ඇති වෙනව. මම හිතන්නෙ නැහැ ඒක කවදාවත් නැති වෙයි කියල."

- *විහඟ (අවු. 32 යි, ගාල්ලේ සිට)*

සමීක්ෂණයට සහභාගී වූ පුද්ගලයින් පැවසුවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් සිය සමාජභාවී අනන්‍යතාවය සහ බාහිර පෙනුම අතර ඇති නොගැලපීම හේතුවෙන් ඇතිවන පීඩාකාරී හැඟීම නොහොත් ලිංගභාවය පිළිබඳ කනස්සල්ලක් අත්දකින බවයි. සාම්ප්‍රදායික පුරුෂභාවය හා බැඳුණු සමාජයීය අපේක්ෂාවන් හේතුවෙන් වඩාත් නරක අතට හැරී ඇති මෙම හැඟීම, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට සිය ප්‍රතිරූපය සහ ආත්ම අභිමානය ගවේෂණය කිරීම අභියෝගාත්මක ප්‍රයත්නයක් බවට පත්කර ඇත.

සහභාගීවූවන් සමග පැවැත්වූ සාකච්ඡාවලදී මතුවූ කරුණක් වන්නේ සමාජය බොහෝ අවස්ථා වලදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ද පුරුෂ ලිංගික අවයව උපතින්ම ලැබුණු ස්ත්‍රීක සමාජභාවීය පිරිමි පුද්ගලයින් මෙන් වියයුතු යැයි බලාපොරොත්තු වන බවයි. එනම්, ඔවුන් සාම්ප්‍රදායික පිරිමි ඒකාකෘති වලට අනුගතවන ආකාරයට පෙනී සිටිනු ඇති බව සහ හැසිරෙනු ඇති බවයි. සමාජයීය අපේක්ෂාවලට අනුගත නොවුනහොත් තමන්ව වැරදි ලෙස විනිශ්චය කරනු ඇති බවටත් වෙනස්කොට සැලකීමට ලක්වනු ඇති බවටත් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් තුළ ඇතිවිය හැකි බිය හේතුවෙන්, මෙම පීඩනය (ඔවුන් තුළ) තමන් සැලකිය යුතු පුද්ගලයෙක් නොවන බව සහ සාංකාව වැනි හැඟීම් ඇති කළ හැකිය.



© 2023 **Équité Sri Lanka**

අහිතකර පුරුෂභාවය හා බැඳුණු නැඹුරුතා නිසා කෝපය හැරුණු කොට වෙනත් හැඟීම් විවෘතව ප්‍රකාශ කිරීම අධෛර්යමත් කරයි. සමීක්ෂණයට සහභාගීවූවන් සමග පැවැත්වූ සාකච්ඡාවලදී නිරීක්ෂණය වූ ආකාරයට, පුරුෂභාවය යනුවෙන් හඳුනාගෙන ඇති රාමුවට අනුගතවීම සඳහා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් දුක, බිය සහ අනාරක්ෂිත බවක් දැනීම වැනි සිය හැඟීම් යටපත් කරයි. මෙම හැඟීම් ප්‍රකාශ කිරීම ඔවුන්ගේ පුරුෂභාවය අඩු කර පෙන්වනු ඇති බවටත්, එසේත් නැත්නම් ඔවුන්ගේ අනන්‍යතාවය යටපත් කරනු ඇති බවටත්, ඔවුන් බියක් දක්වයි. මෙම හැඟීම් යටපත් කිරීම, ඔවුන්ගේ මානසික සහ චිත්තවේගීය යහපැවැත්ම කෙරෙහි දැඩි බලපෑම් ඇති කරයි.


© 2023 **Équité Sri Lanka**

# සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවය සමග ජීවත්වීම

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයකු ලෙස තමන්ව හඳුන්වා ගැනීමේදී එය කෙතරම් පහසුවකින් කළ හැකිද යන්න සාකච්ඡා කිරීමේදී, සමීක්ෂණයට සහභාගී වූ පිරිස මත දෙකක් පළකරන ලදී. සමීක්ෂණයට සහභාගී වූ පිරිසෙන් 83%ක් පැවසුවේ සංක්‍රාන්ති ක්‍රියාවලියට පෙර තමන් ගතකළ ජීවිතය වර්තමානයේදී ගත කරන ජීවිතයට සම්පූර්ණයෙන්ම වෙනස් ජීවිතයක් බවයි. සමීක්ෂණය හරහා පැහැදිලි වූ කරුණක් වන්නේ, ඔවුන් සිය අතීත (සංක්‍රාන්ති ක්‍රියාවලියට පෙර) ජීවිතය අත්හරින බවත්, ඒ කාලයට සම්බන්ධ තවමත් පවතින කුමන හෝ සම්බන්ධතාවක් තමන්ව අර්ථකථනය නොකරන පැරණි දෑ ලෙස සලකන බවත් ය. කෙසේනමුත්, තමන්ගේ සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ සැත්කම් සිදුකරගැනීමට නොහැකි බැවින්, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් සිය එදිනෙදා ජීවිතයට අදාළ කටයුතු කරගැනීමේදී අභියෝගවලට මුහුණපායි.

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් වඩාත් ඍජුවම මුහුණපාන අභියෝගයක් වන්නේ ආරක්ෂාකාරී සහ වෙනස්කොට සැලකීමට ලක් නොවන වැසිකිළි/විවේකාගාර පහසුකම් භාවිත කිරීමට ඇති සීමාසහිත හැකියාවයි. සාමාන්‍යයෙන් පොදු වැසිකිළි/විවේකාගාර නිර්මාණය කොට ඇත්තේ ස්ත්‍රී-පුරුෂ ද්විත්ව සමාජභාවී අනන්‍යතාවයන් ඉලක්ක කොටගෙන වන අතර, ඒ හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට පහසුතාවක් සහ ආරක්ෂාකාරී ආකාරයෙන් එම පහසුකම් භාවිතා කිරීම අපහසු වී ඇත. මෙම තත්වය අපහසුතාවක් හෝ සාංකාවක් ඇතිකිරීම, එසේත් නැත්නම් පොදු වැසිකිළි/විවේකාගාර භාවිතයෙන් මුළුමනින්ම වැළකී සිටීම වැනි තත්වයන්ට හේතු වේ.

"දවසක් මම වැඩ කරන තැන ඉද්දි හදිසියේම ඔසප් වුනා. අවංකවම කියනවනම් මම දැනගෙන හිටියේ නැහැ මොකක් කරන්නද කියල, ඒ වගේම නාන කාමරය පාවිච්චි කරන්නෙ කොහොමද කියල. මට මගේ සනීපාරක්ෂක තුවා විසිකරන්න කිසිම පහසුකමක් තිබ්බෙ නැහැ. මට අසරණකමක් දැනුන."

- *නුවන් (අවු. 27 යි, කුරුණෑගල සිට)*

සනීපාරක්ෂක පහසුකම් භාවිතයට ඇති හැකියාව අඩුකම දැඩි සෞඛ්‍ය ගැටළු ඇති කළ හැකිය. සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට නිසි සනීපාරක්ෂාව සම්බන්ධ පහසුකම් ලබාගැනීමට නොහැකි විය හැකි අතර, විශේෂයෙන්ම ඔසප් සමයේදී මෙම තත්වය ආසාධන සහ අනෙකුත් සෞඛ්‍ය ගැටළු ඇතිවීමේ හැකියාව ඉහළ නැංවිය හැකිය.

නිසි සම්බන්ධතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට අභියෝගාත්මක කරුණක් බවද සාකච්ඡා විය. ඒ, ඔවුන්ගේ සංක්‍රාන්ති ක්‍රියාවලිය අවබෝධ කරගැනීමට සහ ඊට හුරුවීමට කාලය අවශ්‍ය විය හැකි සහකරුවන්/සහකාරියන් සමග සංකීර්ණ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔවුන්ට බොහෝ අවස්ථාවලදී සිදුවන බැවිනි. සමාජයීය සම්මත, පෞද්ගලික විශ්වාස, මෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයා සහ ඔවුන්ගේ සහකරුවා/සහකාරිය ඔවුන්ගේ සම්බන්ධතාවයට ලබාදෙන ඔවුන්ට විශේෂිත වූ අත්දැකීම් ඇතුළු විවිධ සාධක හේතුවෙන් මෙම ගැටලුව ඇති විය හැකිය.

සමීක්ෂණය මතුකළ තවත් කරුණක් වන්නේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට බොහෝ අවස්ථාවලදී ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවය සහකරුවෙක්/සහකාරියක් විය හැකි අයකුට හෝ පවුලේ



© 2023 **Équité Sri Lanka**

සාමාජිකයින්ට හෙළිකරන්නේ කෙසේදැයි යන්න ඉතා අභියෝගාත්මක දෙයක් වන බවයි. තමන්ගේ අනන්‍යතාවය සහ සමාජයීය අපේක්ෂාවන් යන කරුණු දෙකම බලපාන සංකීර්ණ තත්වයක් සමග ගනුදෙනු කිරීමට සිදුවීම හේතුවෙන්, මෙම ක්‍රියාවලිය මානසිකව සහ චිත්තවේගාත්මකව සංකීර්ණ එකක් වන බවද සහභාගීවූවන් පවසන ලදී.

ප්‍රතික්ෂේප වීමේ බිය ඔවුන්ගේ මනස තුළ දැඩි ලෙස මුල්බැසගෙන ඇති අතර, එය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් තවමත් මුහුණපාන වෙනස්කොට සැලකීම සහ පූර්ව විනිශ්චය සම්බන්ධ අත්දැකීම්වලින් ඇති වන තත්වයකි. මෙම බිය සාංකාව, පසුබට වීම, හෝ අනාරක්ෂිත බවක් දැනීම යන ආකාරවලින් ප්‍රතීයමාන විය හැකිය. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් මුහුණපාන ගැටළු පිළිබඳව බොහෝ පුද්ගලයින්ට දැනුම හෝ අවබෝධය නොමැති විය හැකි අතර, ඒ හේතුවෙන්, දුර්මත සහ දැනුවත්භාවය අඩුකම නිසා ඇතිවන ප්‍රතිචාරද දැකිය හැකිය. මේ තත්වය හේතුවෙන්, ඇතැම් සහභාගීවූවන් පැවසුවේ ආදරය මත පදනම් වූ සම්බන්ධයකට ඇතුළත්වීමට වැඩි ඉඩකඩක් ඇති සහකාරියක් ලෙස ඔවුන් සමරිසි කාන්තාවන් දකින බවයි. කෙසේනමුත්, සහභාගී වූ පිරිස තවදුරටත් පැවසුවේ, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ මෙම ආකල්පය අහිතකර සබඳතා ඇතිකරගැනීමට හේතුවන බවයි.


© 2023 **Équité Sri Lanka**

# නීතිමය සහ ප්‍රතිපත්ති පසුබිම

ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සම්බන්ධයෙන් පවතින නීතිමය සහ ප්‍රතිපත්තිමය තත්වය පසුගිය වසර කිහිපය තුළ දැඩි වෙනස්කම්වලට ලක්ව ඇත. නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව තුළ සිදුවන අධිවාචන කටයුතු කිසිදා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව ඉලක්ක කර නොගත් අතර, සංක්‍රාන්ති සමාජභාවී ලෙස හඳුනාගන්නා සියලුම පුද්ගලයින්ට අදාලව පොදු ප්‍රවේශයක් ගෙන ඇත. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ අයිතීන් හඳුනාගැනීම සහ ආරක්ෂා කිරීම අතින් ශ්‍රී ලංකාව ප්‍රගතියක් අත්කරගෙන ඇති නමුත්, මේ සම්බන්ධයෙන් විශාල අභියෝග පවතී.

සමාජභාවී අනන්‍යතාවය සහ SOGIESC යටතේ පැමිණෙන අනෙකුත් අනන්‍යතා/ලක්ෂණ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව හරහා තවමත් හඳුනාගෙන නැත.[1] සිව්වැනි UPR චක්‍රයේදී ශ්‍රී ලංකාවට ලැබුණු නිර්දේශ අතර සමාජභාවී අනන්‍යතාවය ව්‍යවස්ථාව යටතේ පිළිගැනීමට අවශ්‍ය පියවර ගැනීමට රාජ්‍යයට බලකරන ජාත්‍යන්තර නිර්දේශද ඇතුළත් වූ අතර, කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් යෝජනා කර ඇති සමාජභාවී අනන්‍යතා සමානාත්මතා කෙටුම්පත තුළ එම සංශෝධනය ඇතුළත් කර ඇත.

අංක 01-34/2016 දරන චක්‍රලේඛය යටතේ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට තමන්ගේ නීතිමය ලියකියවිලි උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය, විදේශ ගමන් බලපත්‍රය, සාමාන්‍ය පෙළ / උසස් පෙළ වැනි සමහර අධ්‍යාපන සහතික ශ්‍රී ලංකාව තුළදී වෙනස් කළ හැකිය. කෙසේ නමුත්, මෙම ක්‍රියාවලිය තුළ සිටින රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශවකරුවන් සහ සේවා සපයන්නන් සංක්‍රාන්ති ක්‍රියාවලිය පිළිබඳව දැනුවත්භාවය අඩුකමක් පෙන්වයි. මේ හේතුව නිසා, සිය නීතිමය ලියකියවිලි වෙනස් කිරීමේදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් වෙනස්කොට සැලකීම්වලට මුහුණ පායි.

"මගේ උප්පැන්න සහතිකය වෙනස් කරගන්න මම අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියා. ලේඛන වෙනස්කිරීමේ ක්‍රියාවලිය ගැන මට මුණගැහුණු නිලධාරියාට කිසිම දැනුමක් තිබුනෙ නැහැ. ඒවගේම අනවශ්‍ය ලේඛන පුරවන්න කියලත් එයා මට කිව්ව. මේ නිලධාරීන්ට කතා කරල, මගේ උප්පැන්න සහතිකය වෙනස් කිරීම සම්බන්ධ ඉල්ලීමට අදාළ වැඩකටයුතු කරන්න එකඟ කරගන්න මට සිදු වුනා එක්තරා සංවිධානයකින් උදව් ගන්න.

- *තරිඳු (අවු. 22 යි, අත්තනගල්ලේ සිට)*

සමීක්ෂණයට සහභාගී වූ පිරිස ප්‍රකාශ කළේ, සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට පත්වීමට ඇති හැකියාව අවම බවයි. කෙසේනමුත්, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගී වූ පිරිස සඳහන් කළේ LGBTIQ+ ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැලකීම්වලට මගපාදන නීති ඔවුන්ට බලපෑමක් ඇතිකරන බවයි. ඒ, සාමාන්‍ය ජනතාව අතර LGBTIQ+ ප්‍රජාව කෙරෙහි ඍණාත්මක අදහසක් ඇතිකිරීමට මෙම නීතිවලට හැකි බැවිනි.

[1] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිලිබඳ වන III වැනි පරිච්ඡේදය යටතේ ඇති, සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම සම්බන්ධයෙන් වන 12(2) වගන්තිය යටතේ සඳහන් වන්නේ "කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය" යනුවෙනි.



© 2023 **Équité Sri Lanka**

“මිනිස්සු හිතනව සංක්‍රාන්ති ක්‍රියාවලිය මේ රටේ නීතිවිරෝධී දෙයක් කියල. මගේ පවුලෙ අය පවා එහෙම හිතනව. ඒක නීතිවිරෝධී දෙයක් නෙමෙයි සහ ඒ ගැන චක්‍රලේඛයක් තියෙනව කියල කොච්චර පැහැදිලි කරන්න හැදුවත් ඒ අය ඒක පිළිගන්නවත් ඇහුම්කම් දෙන්නවත් ලැස්ති නැහැ.”

- *ලක්මාල් (අවු. 25 යි, ගාල්ලේ සිට)*

සහභාගී වූ පිරිස පැවසුවේ මෙම නීතිමය බාධක ඔවුන්ගේ විවාහයට ඍජුවම බලපාන බවයි. ජාතික හැඳුනුම්පත සහ උප්පැන්න සහතිකය වැනි නීතිමය ලියකියවිලි වෙනස්කර ඇති සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයෙකුට විෂමරිසි විවාහයක් ලියාපදිංචි කිරීමට නීත්‍යානුකූලව ඉඩකඩ ඇත. කෙසේනමුත්, උප්පැන්න සහතිකය ඇතුළු ලියකියවිලි ඉදිරිපත් කිරීමේදී විවාහ රෙජිස්ට්‍රාර්වරයා විසින් බොහෝ අවස්ථාවලදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවගේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු දක්නට ලැබේ. මින් පෙනී යන්නේ අදාළ නිලධාරීන් අතර මේ පිළිබඳ ඇති දැනුවත්භාවය අඩුකම සහ ඔවුන්ගේ දැක්ම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට සේවා සැපයීම අවහිර කරන අයුරුයි.

“විවාහ ලියාපදිංචි කරන කාර්යාලයේදි මාව ප්‍රසිද්ධියෙම ලැජ්ජාවට පත් කරා. අපි දෙන්නගෙම පවුල් සාම්ප්‍රදායික පවුල්. ඒක නිසා අපේ කසාදෙ ලියාපදිංචි කරන්න ගියේ පවුලේ සාමාජිකයො කිසි කෙනෙක් නැතුව. අපේ යාළුවො සාක්ෂිකාරයෝ විදියට අත්සන් කරා. විවාහ රේජිස්ට්‍රාර්වරිය මගේ අනන්‍යතාවය ගැන දැනගත්ත ගමන් අපි ඔක්කොටම බැන්න. අපේ යාලුවන්ටත් බැන්න. ඒ සිද්ධිය වෙද්දි එයාගෙ කාර්යාලයෙ ගොඩක් මිනිස්සු හිටිය. අපි හැමෝවම ප්‍රසිද්ධියේ ලැජ්ජාවට පත්කරා.”

- *පසන් (අවු. 25 යි, කොළඹ සිට)*

ශ්‍රී ලංකාව තුළ සමරිසි ලිංගික ක්‍රියා අපරාධීකරණය කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්ති තමන්ට ඇත්තේ සමරිසි ලිංගික නැඹුරුතාවයක් බව හඳුනාගන්නා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවටද බලපායි. සියලු සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් විෂමරිසි බවට දුර්මතයක් බවතින බැවින්, සමරිසි සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් මුහුණපාන නීතිමය අභියෝගවලට අවධානය නොලැබේ.

දූෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින සාමාන්‍ය නීතිය යටතේ හඳුනා ගැනෙන්නේ ශිෂ්ණයක් යෝනියකට ඇතුල් කිරීම පමණි. ඒ හේතුවෙන් පිරිමියකු ලෙස තමන්ව හඳුනාගන්නා පුද්ගලයින්ව මෙම නීතිය යටතේ ගැනෙන්නේ නැති අතර, පිරිමින්ට විරුද්ධව සිදුවන ලිංගික හිංසන සම්බන්ධයෙන් පියවර ගැනෙන්නේ බරපතල ලිංගික අපයෝජන යටතේයි. ආර්ථික තත්වය, සැත්කම් සම්බන්ධයෙන් (ශ්‍රී ලංකාව තුළ) පවතින ප්‍රමාණවත් නොවන වෛද්‍ය විශේෂඥතාව, කොන් කිරීම සහ වෙනස්කොට සැලකීම ඇතුළු විවිධ හේතුන් නිසා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගෙන් බහුතරයක් සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ සැත්කම් සිදුකරන්නේ නැති පසුබිමක, මෙම නීතිමය ප්‍රතිපාදනය ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව අනාරක්ෂිත තත්වයක හෙළා ඇත.

ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයෙකු දරුවකුට උපත ලබාදීමේ අවස්ථාවේදී තවත් නීතිමය ගැටළුවක් ඇති වේ. සිය ගර්භාෂය සහ ඩිම්බ කෝෂ (ඉවත් නොකර) තබාගන්නා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට ගර්භණීබවට පත්වීමට සහ දරුවෙකුට උපත ලබාදීමට හැකියාව ඇත. ශ්‍රී ලංකාව තුළ එවැනි අවස්ථාවකට පහසුකම් සැපයීමට නීතිමය රාමුවක් නොමැත. උපත ලැබූ දරුවාට උප්පැන්න සහතිකයක් නිකුත් කිරීමේදී ලියකියවිලි සැකසීමේ ක්‍රියාවලියේදී තමන්ව දරුවාගේ මව ලෙස හඳුනාගන්නවාද එසේත් නැත්නම් පියා ලෙස හඳුනාගන්නවාද ලෙස සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයා ගැටළු ගණනාවකට මුහුණපායි.


© 2023 **Équité Sri Lanka**

# වෙනස්කොට සැලකීම සහ කොන්කිරීම

සමාජය තුළ තමන්ව පූර්ණ වශයෙන් පිළිගැනීමට බාධාවක් වී ඇති බරපතල කොන්කිරීම් සහ වෙනස්කොට සැලකීම් සමග සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව දිගින් දිගටම සටන් කරයි. සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවේ කටුක බලපෑම්වලට බොහෝ අවස්ථාවලදී ලක්වන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් පූර්ව විනිශ්වය, දූර්මත සහ මතග්‍රාහීත්වයට එරෙහි සටනක නියැලී සිටී. ඔවුන්ගේ අනන්‍යතා සහ අත්දැකීම් ප්‍රතික්ෂේප වන අතර, වැරදි ලෙස වටහා ගැනීමද සිදුවේ. එසේම, ඔවුන්ව නිරන්තරයෙන් සිය වටිනාකම අවතක්සේරු කිරීමට සහ ආන්තිකකරණයට ලක් වේ. වෙනස්කොට සැලකීම විවිධ ආකාරවලින් පැවතිය හැකි අතර, එය සමාජය තුළ කොන්කිරීමට ලක්වීමේ සිට, වෘත්තීමය විෂමතා, සෞඛ්‍ය සේවා තුළ අසමානතා සහ ප්‍රචණ්ඩත්වය දක්වා විහිදී යා හැකිය. තනිවීම සහ අනාරක්ෂිත වීම වැනි හැගීම් වඩාත් නරක අතට හරවමින්, මෙම අසමානතා සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ මානසික සහ චිත්තවේගාත්මක යහපැවැත්ම කෙරෙහි හානිදායක බලපෑමක් ඇති කළ හැකිය.



© 2023 **Équité Sri Lanka**

# සියල්ල පටන්ගන්නේ "පවුලෙනි"

පවුල යනු ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම සමාජ ආයතනයකි. LGBTIQ+ ප්‍රජාවේ සාමාජිකයින් බොහොමයක් දෙනා මෙන්ම, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ද ප්‍රථම වතාවට කොන්කිරීම සහ වෙනස්කොට සැලකීමට ලක්වන්නේ පවුල තුළයි. සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට එරෙහිව පවුල තුළ පවතින වෙනස්කොට සැලකීම විවිධ ආකාරවලින් මතුවිය හැකි අතර, මේවා සියල්ලම සිත් රිදවන සුළු සහ පුද්ගලයාගේ යහපැවැත්මට දැඩි ලෙස හානිදායක ඒවා වේ.

"මගේ සමාජභාවී අනන්‍යතාවය මගේ පවුලෙ අයට පැහැදිලි කරන්න මම බොහෝ වාර ගාණක් උත්සාහ කරා. ඒගොල්ලන්ට මේක තේරෙන්නෙ නැද්ද නැත්තම් මට ඇහුම්කම් දෙන්න ලැස්ති නැද්ද කියල මට පැහැදිලි නැහැ. මම ඒගොල්ලන්ට ගොඩක් ආදරෙයි. නමුත් මට ඒගොල්ලෝ එක්ක ඉන්න ගමන් මම කැමති විදියට ඉන්න බැහැ. මේ නිසා මම දැනට වෙනම ජීවත් වෙන්නෙත්. ඒගොල්ලො මාව තේරුම්ගනියි කියල සහ මට ගෙදර යන්න පුළුවන් වෙන්න කියල මම ප්‍රාර්ථනා කරනව."

- *ප්‍රමෝද් (අවු. 30 යි, නුවර සිට)*

පවුල තුළ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි අනන්‍යතාවය සම්බන්ධයෙන් පවතින කොන්කිරීම බොහෝ අවස්ථාවලදී පැනනගින්නේ අවබෝධය මදිකම, බිය, සහ සාම්ප්‍රදායික සමාජභාවී අනන්‍යතා සම්බන්ධ සම්මතයන්ට අනුකූලව ජීවත්වීම හේතුවෙනි. සිය ආදරණීයයන් ඔවුන්ට වෙනස් සමාජභාවී අනන්‍යතාවයක් ඇතැයි විශ්වාස කරනවා යන කරුණ පිළිගැනීමට බොහෝ පවුල් වෙර දරයි. සහභාගීවූවන් පැවසූ ආකාරයට, මෙම ප්‍රතිරෝධය හේතුවෙන් ප්‍රතික්ෂේපවී සහ තනිවී ඇතැයි හැඟීමක් ඇති වේ.

"මම ඉන්නෙ මගේ පවුලෙ අය ත් එක්ක නෙමෙයි. ඇත්තම කියනවනම් මම ඒ අයට බයයි. මම ජීවත් වෙන්නෙ හැංගිලා. මගේ පවුලෙ අය, විශේෂයෙන්ම මගේ අම්ම, මාව කොහෙත්ම පිළිගන්නෙ නැහැ."

- *සහන් (අවු. 37 යි, නුවර සිට)*

සමීක්ෂණයට සහභාගී වූ පුද්ගලයින් තවදුරටත් පැවැසුවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වීම යනු කුමක්දැයි පූර්ණ වශයෙන් අවබෝධ කරගන්නේ නොමැති බවයි. ඔවුන් සඳහන් කළ පරිදි, මෙම තත්වය කෙටි කාලයක් පමණක් පවතින හැඟීමක් හෝ තෝරාගැනීමක් වැනි දුර්මත පවුල්වල සාමාජිකයින් අතර පවතී. මෙම අවබෝධය ප්‍රමාණවත් නොමැති තත්වය අසංවේදී බවක් ඇති කිරීම, ප්‍රතික්ෂේප කිරීම්වලට මගපාදා ඇත.

"මම සංක්‍රාන්ති ක්‍රියාවලිය පටන්ගත්තොත් සියදිවි නසාගන්නව කියල මගේ අම්ම කිව්ව. ඒ වේලාවෙ මොනව කරන්නද කියල අවංකවම මම දැනගෙන හිටියෙ නැහැ. එයා මට ලොකු පීඩනයක් එල්ල කරා. හැමතිස්සෙම මගෙ හිත අවුලෙන් ඉන්න වෙන තැනට වැඩ කරා. කවදාවත් මට මම ගැන සතුටක් තිබ්බෙ නැහැ. ඒ කම්පනය මට තවමත් වධ දෙනවා."

- *පසිඳු (අවු. 26 යි, දෙහිවල සිට)*

සමීක්ෂණයට සහභාගී වූ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගෙන් 61%ක් සඳහන් කළේ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින්, විශේෂයෙන්ම ඔවුන්ගේ මව, ඔවුන් තුළ වරදකාරී හැඟීමක් ඇතිකිරීමට


© 2023 **Équité Sri Lanka**

උත්සාහ කර ඇති බවත්, එය ඔවුන්ට බරපතල මානසික බලපෑමක් ඇති කළ බවත් ය. ඔවුන් තවදුරටත් පැවසුවේ සිය පවුල්වලින් ලැබෙන සහයෝගය සහ ආදරය මදිකම හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව තුළ තමන් පිළිබඳව සැකයක් ඇතිකර ඇති බවයි. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වීම තෝරාගැනීමක් නොවන බව ඔවුන්ගේ පවුල් වටහාගැනීම අතිශයින්ම වැදගත් වේ. එය ඔවුන්ගේ අනන්‍යතාවයේ කොටසක් වන අතර, සමාජභාවී අනන්‍යතාවය කුමක් වුවත්, ඔවුන්ටද ආදරය, පිළිගැනීම සහ සහයෝගය ලැබිය යුතුය. ඔවුන්ගේ පවුල්වලින් ඒවා ලැබීම වඩාත් වැදගත් වේ.


© 2023 **Équité Sri Lanka**

# සෘණාත්මක බැල්මක් යටතේ ජීවත්වීම

සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව යනු විවිධ සමාජභාවී අනන්‍යතා පුරා විහිදුණු සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට බලපාන, මුල්බැසගෙන ඇති, හානිදායක පූර්ව විනිශ්චයෙන් වේ. සමාජයීය දූර්මත සහ මතග්‍රාහීත්වයන් හේතුවෙන් විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් විශේෂ වූ අභියෝගවලට මුහුණපායි. වාචික හිංසන, ශාරීරික ප්‍රචණ්ඩත්වය, වෙන්කොට සැලකීම, සහ වක්‍රාකාරව හෝ සිතා මතා නොකරන වෙනස්කොට සැලකීම් ඇතුළු විවිධ ආකාරවලින් මෙම තත්වය ඉස්මතු වේ. පුද්ගලයින් උපතේදී පවරා දුන් ලිංගිකත්වයට අනුකූලව ජීවත් විය යුතු බවට වන අපේක්ෂාව, එසේත් නැත්නම් ස්ත්‍රී-පුරුෂ ද්විත්ව සමාජභාවී අනන්‍යතාවය ශක්තිමත් කරන, නොදැනුවත්කම, බිය, සහ සමාජයීය සම්මතයන් තුළ සංක්‍රාන්ති සමාජභාවී භීතිකාව මුල්බැසගෙන ඇත. උපතේදී ගැහැණු ලෙස පවරා දුන් නමුත් පසුව පිරිමි ලෙස හඳුනාගත් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් බොහෝ අවස්ථාවලදී සිය අනන්‍යතාවය සමාජයීය අපේක්ෂා සමග නොගැලපීම හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවට මුහුණපායි.

සමීක්ෂණයට සහභාගී වූ පිරිසෙන් 92%ක් පමණ සඳහන් කළේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් දෙස සමාජය බලන ආකාරය හේතුවෙන් ඔවුන්ට සිය අනන්‍යතාවය සඟවා සිටීමට සිදුව ඇති බවයි.

"ලොකුම ප්‍රශ්නෙ තමයි සමාජය, ඒවගේම මිනිස්සු අපි දිහා බලන විදිය. ඒගොල්ලො අපි දිහා බලන්නෙ මේ සමාජයට අයිති නැති පිටසක්වල ජීවියෙක් දිහා බලනව වගේ. අපිට කවදාවත් සාමාන්‍ය විදියට සලකන්නෙ නැහැ, සහ එතන තමයි ලොකුම ප්‍රශ්නය තියෙන්නෙ."

- *රශ්මික (අවු. 22 යි, කෑගල්ලේ සිට)*

සමීක්ෂණයට සහභාගී වූ පිරිස තවදුරටත් පැවසුවේ නාගරික ප්‍රදේශයක ජීවත් වනවානම් හැර ඔවුන්ට සිය ගම්පළාත්වල ජීවත්වීම අපහසු බවයි. ඔවුන්ට අනුව, අවට ජීවත්වන ප්‍රජාවන් බොහෝ අවස්ථාවලදී සෘණාත්මක අදහස් පළකරන අතර, ඒ හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් එම ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාවන්ගෙන් ඈත්වනවා සේම සිය අනන්‍යතාවය පිළිබඳ කිසිවෙක් නොදන්නා පළාත්වලට සංක්‍රමණය වීමද සිදු වේ.

"මම ජීවත් වෙන්නෙ ගමක. ඇත්තටම ගමෙත් ඇතුලට යන්න ඕනෙ මගේ ගෙදරට යන්න. එහෙ ජීවත් වෙන එක ගොඩක් අමාරුයි. අපෙ ගමේ අනිත් තරුණයින්ගෙන් මට මරණ තර්ජන පවා එල්ල වෙලා තියෙනව. ඇත්තටම මම ජීවත් වෙන්නෙ බයෙන්. විශේයෙන්ම රෑට මම තනියම කොහෙවත් යන්නෙ නැහැ."

- *ලශාන් (අවු. 23 යි, නුවර සිට)*

මෙවැනි වෙනස්කොට සැලකීම් බොහෝ අවස්ථාවලදී පදනම් වන්නේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සහ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව ඇති දූර්මත හේතුවෙනි. සමීක්ෂණට සහභාගී වූ පිරිස පවසන්නේ සමාජයේ බහුතරයක් දෙනා සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතා පිළිබඳව දැනුවත් නොමැති බවත්, ඔවුන් එම අනන්‍යතා හඳුනාගන්නේ පුද්ගලයෙකු විසින් මුහුණපාන ව්‍යාකූල කාල පරිච්ඡේදයක් ලෙස බවත්ය. මෙම විශ්වාසය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලන්ගේ අත්දැකීම් යටපත් කරන අතර, ඔවුන්ට ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඇති සත්‍ය සහ වලංගු හැඟීම් ප්‍රතික්ෂේප කරයි. මෙම දැනුවත්භාවය අඩුකම ජනතාව අතර සෘණාත්මක කුතුහලයන් ඇති කරන අතර, මෙහිදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගයලන්ගේ ශරීරය



© 2023 **Équité Sri Lanka**

පිළිබඳව ඇතිවන කුතුහලය විශේෂ වේ. මිනිසුන් පුද්ගලයින්ව ඔවුන්ගේ ශාරීරික ලක්ෂණවලට සීමාකරන විටදී, එසේත් නැත්නම් ඔවුන්ගේ ලිංගික අවයවවලට පමණක් අවධානය යොමු කරන විටදී, එය හානිදායක ඒකාකෘති පවත්වාගෙන යාමට සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව කොන්කිරීමටද හේතුවේ.

“මම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙක් කියල දැනගත්තම මිනිස්සුන්ට දැනගන්න ඕන මුල්ම දේ තමයි මගේ ලිංගික ජීවිතය ගැන. සමහර අය මේ ගැන කෙලින්ම අහන්නෙ නැහැ. ඒගොල්ලො කරන්නෙ ඔයා ළමයි හදන්නෙ කොහොමද ඔයා ඉන්න විදිය ගැන ඔයාට සතුටුද වගේ ප්‍රශ්න අහන එක. හැබැයි මිනිස්සු මගේ ලිංගික අවයව ගැන, ඒවා වැඩකරන්නෙ කොහොමද සහ අපිට අපේ සහකරුවාව/සහකාරියව තෘප්තිමත් කරන්න පුලුවන්ද වගේ දේවල් මුනටම අහපු අවස්ථාත් තිබිල තියෙනව. මේව අතිශයින්ම පුද්ගලික ප්‍රශ්න. මේවා අහල ඒගොල්ලො අපිව අපහසුතාවයට පත්කරනව.”

- *ලසිත් (අවු. 32 යි, කුරුණෑගල සිට)*

සමීක්ෂණයට ලැබුණු ප්‍රතිචාර අතරේ ඉස්මතු වූ කරුණක් වන්නේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් පිළිබඳව සමාජයේ ඇති ප්‍රමාණවත් නොවන දැනුවත්භාවය හේතුවෙන් පුද්ගලයෙකුගේ සමාජභාවී අනන්‍යතාවය හෝ සංක්‍රාන්ති ක්‍රියාවලිය පිළිබඳව අතිශය පෞද්ගලික හෝ ආක්‍රමණශීලී ප්‍රශ්න ඇසීම සිදුවන බවත්, එය ඔවුන්ට අගෞරවනීය බවක් හඟවන ක්‍රියාවක් වියහැකි බවත් ය. දැනුවත්භාවය අඩුකම හේතුවෙන් ජනතාවගෙන් බහුතරයක් දෙනා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සමග සම්බන්ධ වන්නේ කුතුහලය මත පදනම් වූ අසංවේදී බවක් හෝ අපහාසාත්මක බවක් ඇතුව බව සහ, එය සිත්රිදවන සුළු අත්දැකීම් ඇතිකිරීමට සහ ඒකාකෘති දිගටම පවත්වාගෙන යාමට හේතුවන බව ඉහත සඳහන් කර ඇති ඔවුන් හෙළිකළ ජීවිත කතා පෙන්වයි.


© 2023 **Équité Sri Lanka**

# ආගමික බලපෑම

සමාජයන්, සංස්කෘතීන් සහ පුද්ගල විශ්වාස සහ සාරධර්ම හැඩගැස්වීමෙහි ලා ආගම යන සංකල්පය අතිශයින්ම වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත. ආගම බොහෝ අවස්ථාවලදී සැනසීම, ප්‍රජාව සහ මගපෙන්වීම ලබාදෙන මූලාශ්‍රයක් වන නමුත්, විවිධ සමාජභාවී අනන්‍යතා, ප්‍රකාශනයන් සහ ලිංගික නැඹුරුතාවයන් ඇති ප්‍රජාවන් ඇතුළු ආන්තිකකරණයට ලක් වූ කණ්ඩායම්වලට එරෙහි වෙනස්කොට සැලකීම් සාධාරණීකරණය කිරීමට සහ පවත්වාගෙන යාමට භාවිතා කළ හැකි මෙවලමක් වශයෙන්ද ආගම භාවිතා වී ඇත.

"මට ලොකු කැමැත්තක් තිබ්බ පන්සල් යන්න. පන්සලක් කියන්නෙ මට ලොකු සැනසීමක් දැනුන තැනක්. මම පන්සල් යනව කිව්වම මගේ දෙමව්පියෝ කවදාවත් මාව ප්‍රශ්න කලේ නැහැ. මම සංක්‍රාන්ති ක්‍රියාවලිය පටන්ගත්තම මට පන්සල් යන්න පුළුවන් තත්වයක් තිබ්බෙ නැහැ. පෙර ආත්මවල කරල තියෙන පින් නිසා පිරිමියෙක් වෙලා ඉපදෙන්න පුළුවන් කියල බුද්ධාගමේ තිබ්බට හාමුදුරුවරු කැමති නැහැ අපිව පිරිමි විදියට පිළිගන්න."

- *සඳුන් (අවු. 25 යි, අවිස්සාවේල්ලේ සිට)*

පිරිමින් සහ ගැහැණුන් සම්බන්ධ භූමිකාවන් සහ අපේක්ෂාවන් මුල් කොටගත් ස්ත්‍රී-පුරුෂ ද්විත්ව සමාජභාවී අනන්‍යතාවයන් ආගම් විසින් සාම්ප්‍රදායිකවම පවත්වාගෙන ගොස් ඇත. මෙම අර්ථකතන බොහෝ අවස්ථාවලදී සමාජභාවී අනන්‍යතාවය දිව්‍යමය නියෝගයක් ලෙස සලකන අතර, එක් එක් සමාජභාවී අනන්‍යතාවයට විශේෂිත වූ හැසිරීම්, භූමිකා සහ පෙනුම නියම කරයි. සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව ඇති මෙම ද්විත්ව අවබෝධය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව ආන්තිකකරණයට සහ කොන්කිරීමට ලක්කිරීමට හේතු විය හැකි අතරම, මෙම දැඩිලෙස සීමා පනවන වර්ගීකරණයන්ට අනුකූල නොවන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ද මෙවන් සැලකීම්වලට ලක්විය හැකිය.

"මම මුස්ලිම්, සහ මම ඉපදුනේ ආගම දැඩිව අදහන පළාතක. මගේ ආගම මගේ අනන්‍යතාවය පිළිගන්නෙ නැහැ. මම කාන්තාවක් වෙලා ඉපදුන නිසා හැමතිස්සෙම මගේ ඇඟ ආවරණය කරගෙන ඉන්න ඕන. මම දැන් ඉන්න විදියට (දැන් අඳින පළඳින විදියට) ගම් පළාතට ගියොත් ඒක සලකන්නෙ පවක් විදියට. ගමේ අය ඉස්සරහ මට දඬුවම් ලැබෙනවා, ඒ වගේම මට ලැජ්ජ කරනව. මුස්ලිම් පුද්ගලයක් නම් ඉපදුන විදියට ජීවත්වෙන්න ඕන. උපතින් ගැහැණු වුණු අපි අපේ ඇඟ ආවරණය කරගන්න ඕන, කසාද බඳින්න ඕන සහ ළමයි හදන්න ඕන. අපේ ආගමික පොත්වල තියෙන්නෙ අපි ගැහැණු විදියට සමාජයට අපේ යුතුකම් ඉෂ්ට කරන්න ඕන කියල. ඒගොල්ලො සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව තේරුම් ගන්නෙවත් පිළිගන්නේවත් නැහැ. විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පිරිමින්ව. මව්ලවිතුමාලා (ඉස්ලාම් ආගමික නායකයින්) අපිව දකින්නෙ පව්න් පිරුණු පුද්ගලයින් විදියට. මට මගේ ගම් පලාතෙන් එළියට එන්න සිද්ධවුනේ ප්‍රධාන වශයෙන්ම ඒගොල්ලන්ගේ බලපෑම නිසා. ඒ වගේම පල්ලියට බයේ මගේ පවුල මාව පිළිගත්තෙ නැහැ."

- *මුජාඩ් (අවු. 26 යි, කටුනායක සිට)*

ආගම සම්බන්ධ සංස්කෘතීන් සහ සමාජභාවී අනන්‍යතා (සමාජ) සම්මතයන් ශක්තිමත් කරන පසුබිමක, ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව වෙන්කොට සැලකීමක් සිදුවේ; එසේත් නැත්නම්, සාම්ප්‍රදායික ස්ත්‍රී-පුරුෂ ද්විත්ව සමාජභාවී අනන්‍යතාවයට අදාළ භූමිකාවන්ට ඔවුන් අයත් නොවන නිසා, ඔවුන්ට ආගමික උත්සව, වත් පිළිවෙත් හෝ ප්‍රජාවන් සමග සම්බන්ධ වීමට ඉඩ නොලැබේ.



© 2023 **Équité Sri Lanka**

“මම එන්නෙ හින්දු පසුබිමකින්. රටේ උතුරු පළාත ගත්තම ඒ පැත්තෙ හින්දු ආගමික ස්ථානයකට ඇතුල් වෙද්දි පිරිමි අය කමිසය ගලවන්න ඕන. මම තාමත් සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ ශල්‍යකර්ම කරගෙන නැහැ. ඒව කරල තිබ්බත් කැළැල් පේන්න පුළුවන් නිසා මම කැමති නැහැ පොදු ස්ථානයක මගේ කමිසය ගලවන්න. මේ හේතුව නිසා එක්කො මට ආගමික කටයුතු කරන්න බැහැ, එහෙම නැත්තම් මම ඇඳුම් ඇඳගෙන ඒ කටයුතු කරොත් මිනිස්සු මගෙ දිහා අමුතු විදියට බලනව. මම පූජකතුමාට මගේ සංක්‍රාන්ති ක්‍රියාවලිය ගැන කිව්වොත් මට ආපහු කෝවිලට පය ගහන්න ලැබෙන්නෙ නැහැ.”

- *විෂ්ණු (අවු. 25 යි, කටුනායක සිට)*



© 2023 **Équité Sri Lanka**

# අධ්‍යාපනික පසුබිම

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට එරෙහිව අධ්‍යාපනික ආයතන තුළ සිදුවන වෙනස්කොට සැලකීම සහ කොන්කිරීම, දැනුම ලබාගැනීම සහ පුද්ගල සංවර්ධනය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ගැටළු ලෙස පවතී. දැනුවත්භාවය සහ නීතිමය ආරක්ෂණයන් වැඩිකර ඇතත්, සංක්‍රාන්ති සමාජභාවී ශිෂ්‍යයින් බොහෝ අවස්ථාවලදී පූර්ව විනිශ්චයට, හිංසනයට සහ වෙන්කොට සැලකීම්වලට මුහුණපෑමට සිදුවන මිත්‍රශීලී නොවන පරිසරයක් අත්දකී.

"නිල ඇඳුම තමයි ඉස්කෝලෙ යන කාලෙ මට තිබ්බ ලොකුම ගැටලුව. ගවුම් අඳින්න මම පොඩ්ඩක්වත් කැමති නැහැ. නමුත් හැමදාම මට ඉස්කෝලෙ යන්න ගවුම් අඳින්න වුනා."

- *සුරේෂ් (අවු. 27 යි, නුවර සිට)*

ඉහත සඳහන් වන්නේ සමීක්ෂණයට සහභාගී වූ සියලුම දෙනා කළ ප්‍රකාශයකි. අධ්‍යාපනික පසුබිම් තුළ සමාජභාවී අනන්‍යතාවයට විශේෂිත වූ නිල ඇඳුම්වලින් සැරසීමට නියම වන අවස්ථාවන්හිදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් අපහසුතාවයට පත්වන බව සමීක්ෂණය තුළින් දක්නට ලැබිණ. සාමාන්‍යයෙන් සංක්‍රාන්ති සමාජභාවී නොවන පුද්ගලයින්ට නිර්මාණය කරන මෙම නිල ඇඳුම් සංක්‍රාන්ති සමාජභාවී ශිෂ්‍යයින් අත්දකින ලිංගිකත්වය පිළිබඳ කනස්සල්ල වඩාත් නරක අතට හරවයි. ඔවුන්ගේ සැබෑ සමාජභාවී අනන්‍යතාවය සහ ඔවුන්ට ඇඳීමට බලකෙරෙන ඇඳුම් ඔවුන්ව අන්‍යයන්ගෙන් වෙන්කර සැලකීම සහ සාංකාව සම්බන්ධ හැඟීම් ඇති කරයි. එය, ඔවුන්ගේ අනන්‍යතාවය සඳහා අවශ්‍ය පිළිගැනීම සහ ගරුකිරීම වෙනුවෙන් ඔවුන් නියැලී සිටින අරගලය නිතිපතා  සිහිගන්වන්නක් වේ. තවද, මෙම නිල ඇඳුම් ඔවුන්ගේ සංක්‍රාන්ති සමාජභාවී බව නිතැතින්ම ඔවුන්ගේ සම වයසේ අයට හෙළිකරන අතර, එය ඔවුන්ව වෙනස්කොට සැලකීමට සහ අනවශ්‍ය අවධානයට ලක් කිරීමටද සමත් වේ.

"මට ඉස්කෝලෙ අනිත් ලමයින්ගෙන් ගොඩක් අභියෝග ආවෙ නැහැ. සමහරවිට ඒ මම ක්‍රීඩා කරපු නිසා සහ ළමයි අතර ප්‍රසිද්ධ වෙලා හිටපු නිසා වෙන්න ඇති. නමුත් ගුරුවරු මට ඉන්න ගොඩක් අමාරු තත්වයක් ඇති කරා. මගෙ පෙනුම, කොට කොණ්ඩෙ, අඳින විදිය, කතා කරන විදිය සහ මම ඇවිදින විදිය වගේ දේවල් නිසා ඒගොල්ලො මට පීඩනයක් ඇති කරා. සමහර අවස්ථාවල ඒගොල්ලො මගෙ දෙමව්පියන්ට පවා ඉස්කෝලෙට කතා කරා මම ගැන පැමිණිලි කරන්න සහ මගේ විනය හදන්න."

- *ප්‍රභාත් (අවු. 21 යි, කෑගල්ලේ සිට)*

සමීක්ෂණය හරහා ලැබුණු දත්ත මගින් පෙනී යන්නේ වාචික හෝ ශාරීරික හිංසනය, එසේත් නැත්නම් සමවයසේ අයගෙන් හෝ අධ්‍යාපනඥයින්ගෙන් හිංසනයට ලක්වීම, අධ්‍යාපනික පසුබිම් තුළ සුලබ බවයි. සහභාගී වූ පිරිසෙන් 78%ක් ඔවුන් අඩුම තරමින් එක්වරක් හෝ අධ්‍යාපනික පසුබිමක් තුළ හිංසනයට ලක්ව ඇති බව පැවසූ අතර, 59%ක් පැවසුවේ ඔවුන් කිහිප වාරයක් එවැනි හිංසනවලට ලක්ව ඇති බවයි. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලදී සාකච්ඡා වූ අත්දැකීම් අනුව, අධ්‍යාපනික පසුබිම් තුළදී හිංසනයට ලක්වීම විවෘතව මෙන්ම ඉතාමත් සියුම් ආකාරයටද සිදුව ඇත. මෙම හිංසා හුදු වාචික ඇනුම්පද සහ අපහාසවල සිට, සමාජයීය වශයෙන් තනිකිරීම සහ අන්තර්ජාලය හරහා සිදුවන හිංසන දක්වා ව්‍යාප්ත වේ. සහභාගීවූවන් වැඩිදුරටත් සඳහන් කළේ, මෙවන් අත්දැකීම් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගේ මානසික චිත්තවේගීය යහපැවැත්ම කෙරෙහි විශාල සහ කල් පවතින බලපෑමක් ඇති කර ඇති බවයි.



© 2023 **Équité Sri Lanka**

“ඉස්කෝලෙ මාව ඇත්තටම තේරුම් ගත්ත කෙනෙක්, අඩුම තරමෙ ඇහුම්කම්දෙන්න ලෑස්ති කෙනෙක්වත් හිටියේ නැහැ. මම ඉස්කෝලෙ යන්න හරිම ආසාවෙන් හිටියෙ, නමුත් කාලෙත් එක්ක ඒ ආසාව නැති වුනා. ඒ මම ඉස්කෝලෙ යන්න කැමති නැති නිසා නෙමෙයි. මට දැනුනෙ මම ඉස්කෝලෙ ඉන්න ඕන නැති පිටස්තරයෙක් විදියට.”

- *ලහිරු (අවු. 19 යි, කුරුණෑගල සිට)*

සහභාගීවූවන්ගෙන් 86%ක් ප්‍රකාශ කළේ, අධ්‍යාපනික පසුබිම් තුළ සහයෝගය ලබාදෙන, සංවේදී සහ පිළිගන්නා පරිසරයන් නොමැතිවීමේ තත්ත්වයකට සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් මුහුණ දෙන බවයි. බොහොමයක් අවස්ථාවලදී තමන්ව වරදවා වටහාගන්නා හෝ ආන්තිකකරණයට ලක්කරන සමාජයක් තුළ මෙම පුද්ගලයින් දැනටමත් විශේෂිත වූ ගැටලුවලට මුහුණ දෙන අතර, අධ්‍යාපනඥයින් පවා ආරක්ෂාකාරී සහ වෙන් නොකොට පිළිගන්නා පරිසරයක් ඇතිකිරීමට අසමත් වන විට, ඉන් සිදුවන්නේ ඔවුන්ගේ අරගලය තවදුරටත් තීව්‍ර කිරීමක් පමණකි. අපහාසාත්මක ප්‍රකාශ, වැරදි සමාජභාවී අනන්‍යතාවකට අදාළ කර ආමන්ත්‍රණය කිරීම, සහ සහය ලැබීම අඩුකම සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් තුළ තනිවී ඇති හැඟීමක්, සාංකාව සහ විශාදය ඇතිවීමට මග පාදයි. සහභාගී වූ පිරිස පැවසූ ආකාරයට, මෙම තත්වය ඔවුන්ගේ අධ්‍යාපනික කාර්ය සාධනයට, ආත්ම අභිමානයට සහ සමස්ත යහපැවැත්මට බාධා කරනවා පමණක් නොව, සමස්තයක් ලෙස ගත කළ අධ්‍යාපනය හැදෑරීමද අධෛර්යමත් කරයි.


© 2023 **Équité Sri Lanka**

# රැකියා නියුක්තිය

බොහෝ අවස්ථාවලදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් ඔවුන්ගේ වෘත්තීමය සහ පෞද්ගලික ජීවිතවලට දැඩි බලපෑම් ඇති කළ හැකි පීඩාකාරී ආන්තිකරණයට සහ වෙනස්කොට සැලකීමකට සේවා ස්ථානයේදී මුහුණපායි. සියුම් මතග්‍රාහීත්වයන්ගේ සිට සෘජුවම සිදුවන වෙන්කොට සැලකීම දක්වා මෙම වෙනස්කොට සැලකීම විවිධාකාරයෙන් සිදුවිය හැකිය.

"මම සමාගමක ප්‍රධාන ශාඛාවෙ රස්සාවකට අයදුම් කරා. ඒගොල්ලො මට සම්මුඛ පරීක්ෂණයකට එන්න කියල කතා කරා. එකෙන් පස්සෙ ඒගොල්ලෝ කිව්වා මට අවශ්‍ය ඔක්කොම සුදුසුකම් තියෙනවා කියල. එත් මම සංක්‍රාන්ති ක්‍රියාවලියෙ හිටපු නිසා සහ මගේ ඇඳුම නිසා ඒගොල්ලො කිව්වා මට රස්සාව දෙන්න බැහැ කියල."

- *කුෂාන් (අවු. 24 යි, කොළඹ සිට)*

සමීක්ෂණයට සහභාගී වූ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගෙන් 47%ක් පමණ ප්‍රකාශ කළේ, සිය සමාජභාවී අනන්‍යතාවය සහ සේවායෝජකයින්ගේ සාම්ප්‍රදායික අපේක්ෂාවන් අතර ඇති නොගැලපීම හේතුවෙන් රැකියාවලට ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලියට මුහුණදීමේදී ඔවුන් දැඩි අභියෝගවලට මුහුණපාන බවයි. සියුම් ලෙස සිදුවන මතග්‍රාහීත්වයන්ගේ සිට සෘජුවම සිදුවන වෙනස්කොට සැලකීම් දක්වා මෙම බාධක විවිධාකාරවලින් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස, සහභාගීවූවන් පැවසූ ආකාරයට, අයදුම්කරුවෙකුගේ සුදුසුකම් හෝ රැකියාවට සුදුසු බව ඇගයීමේදී සේවායෝජකයින් නොදැනුවත්වම සමාජභාවී අනන්‍යතා එකාකෘති සැලකිල්ලට ගන්නා අතර, එය සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව නොසලකා හැරීමට හෝ අසාධාරණ ලෙස විනිශ්චය කිරීමට හේතුවිය හැකිය. සහභාගී වූ පිරිසෙන් 71%ක් සඳහන් කළේ රැකියාවකට අයදුම්කිරීමේදී තමන් කැමති නම සහ සර්වනාම හෙළිකිරීම සම්බන්ධ ගැටලුවට මුහුණපාන බවත්, ඒ, මෙම තොරතුරු ඔවුන්ට රැකියාව ලබාගැනීමට ඇති අවස්ථාවට සෘණාත්මක ලෙස බලපෑ හැකි නිසා බවත් ය.

"මම දැනට වැඩ කරන්නෙ ආපනශාලාවක කුස්සියෙ අත්උදව්කරන කෙනෙක් විදියට. ඒක කායිකව සහ මානසිකව අභියෝගාත්මක රස්සාවක්; ඒවගේම මාව පිළිගන්නෙ නැති පරිසරයක වැඩ කරන නිසා මාත් එක්ක වැඩකරන අනිත් අයට වඩා මට ඒ රස්සාව කරන එක අමාරුයි. කළමනාකාරීත්වය හැමතිස්සෙම මට අමානුෂික වැඩමුර දෙනව. සමහර වෙලාවට මට මහ රෑ 12ට වැඩ ඉවර කරල ආපහු උදේ 6ට වැඩට එන්න වෙනව. කළමනාකාරීත්වය මාව ස්ථිර කරන්නෙත් නැහැ මම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙක් නිසා. මාත් එක්ක වැඩකරන අයත් මට හිරිහැර කරනව. ඒගොල්ලො මට නම් හදනව, සහ හැමතිස්සෙම මට අපහාස කරනව. ඒ අයව මගඅරින්න ඕන නිසා සමහර වෙලාවට මම දවල් කෑම පැයෙත් වැඩ කරනව."

- *නිශාද් (අවු. 29 යි, බියගම සිට)*

අධ්‍යයනයට සහභාගී වූ පිරිසෙන් 54%ක් පැවසූ පරිදි, සේවා ස්ථානයේදී ඔවුන් කිහිප වරක්ම වෙනස්කොට සැලකීම්වලට ලක්ව ඇත. ඔවුන්ට අනුව, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට සේවා ස්ථානවලදී අභියෝග රාශියකට මුහුණපෑමට සිදුවිය හැකි අතර, ඒවා ඔවුන්ගේ වෘත්තීමය යහපැවැත්මට දැඩි බලපෑම් එල්ල කළ හැකිය. අවාසනාවකට මෙන්, සේවා ස්ථානවලදී බොහොමයක් දෙනා ඔවුන්ව හාස්‍යයට සහ හිංසනයට ලක්කරන අතර, සගයින්ගෙන් වෙන්කොට සැලකීමද සිදු වේ. වෙනස්කොට සැලකීම සහ පූර්ව විනිශ්චය සම්බන්ධයෙන් පවතින නිරන්තර බිය ඔවුන්ගේ ආත්ම අභිමානය සහ විශ්වාසය පලුදු කරන්නේ


© 2023 **Équité Sri Lanka**

ඔවුන්ට පූර්ණ වශයෙන් සිය කටයුතුවල නියැලීම සහ ඊට දායකවීම වඩාත් අපහසු කරමිනි. මෙම තත්වය ඔවුන්ගේ ඵලදායිතාවට සහ රැකියා තෘප්තියට සෘජු සහ සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

"මම වැඩ කරන්නෙ පෞද්ගලික සමාගමක. මම එතන අවුරුදු 3ක් වැඩකරල තියෙනව. මෑතකදී ඒ සමාගමේ ඉහළ තනතුරක් හිස්වුනා, සහ මම ඒකට අයදුම් කරා. මට ඒ තනතුරට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සුදුසුකම් තිබ්බ. නමුත් කළමනාකාරීත්වය මගේ අයදුම්පත සලකා බැලුවෙවත් නැහැ. මට උසස්වීම දෙනව වෙනුවට කළමනාකාරීත්වය මාව පහළ තනතුරකට දැම්ම. මේ සිද්ධියෙන් මම ලැජ්ජාවට පත්වුනා. තවදුරටත් ඒ සමාගමේ ඉන්න එක අමාරු දෙයක්."

- *කෙවින් (අවු. 28 යි, මොරටුවේ සිට)*

සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට ලබාගත හැකි උසස්වීම් අවස්ථා සීමිත වන අතර, මතග්‍රාහීත්වයන් සහ නොදැනුවත්භාවය හේතුවෙන් වෘත්තීමය දියුණුව හඹායාමේදී විශාල බාධකවලට මුහුණපෑමට ඔවුන්ට සිදු වේ. මෙම ගැටලුව සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් නිතර සේවා ස්ථානයේදී මුහුණපාන වඩාත් පුළුල් වූ අභියෝගවල පිළිබිඹුවකි.

"එක එක සමාගම්වල රස්සා කීපයකටම මම අයදුම් කරා. මට කාගෙන්වත් පීඩනයක් එල්ල වෙන්නෙ නැති නිසා ආහාර ප්‍රවාහනය කරන කෙනෙක් වෙන එක ගොඩක් තෘප්තිමත් දෙයක් විදියටයි අවංකවම මට දැනෙන්නෙ. මම සුදුසුකම් තියෙන කෙනෙක්. මගෙ යාලුවන්ගෙන් ගොඩක් අය ඒගොල්ලන්ගෙ රස්සාවලින් මට වඩා සල්ලි හම්බකරනව. දැනට තියෙන ආර්ථික තත්වයත් එක්ක මම හම්බකරන පඩිය ජීවත්වෙන්න මදි වුනත්, කිසි කෙනෙක්ට උත්තර බඳින්න වෙන්නෙ නැති නිසා මම සැනසීමක් දැනෙනව."

- *කෙශාන් (අවු. 27 යි, නුගේගොඩ සිට)*

සමීක්ෂණය තුළින් මතු වූ කරුණක් වන්නේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවේ බහුතරයක් දෙනා (සහභාගී වූ පිරිසෙන් 64%ක් පමණ) අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියාවල නියැලී සිටින බවයි. තමන්ට සේවාස්ථානවලදී පහසුබවක් නොදැනෙන බවත්, එනිසා ස්වයං රැකියාවක නියුතු වීමට හෝ සිය පවුලට, ඥාතියෙකුට හෝ වෙනත් ප්‍රජා සාමාජිකයකුට අයත් ස්ථානයක රැකියාවක් කිරීමට වඩාත් කැමති බැවත් ඔවුන්ගේ අදහස් විය. මෙම කරුණුවලින් පෙනී යන්නේ, රැකියාවල බඳවාගැනීමේ ක්‍රියාලියේ පවතින වෙනස්කොට සැලකීම හෝ සමාන අවස්ථා අඩු බව හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් අඩු වශයෙන් රැකියාවල නියුතු බව එසේත් නැත්නම් ඔවුන්ගේ සුදුසුකම්වලට නොගැලපෙන රැකියාවල යෙදී සිටින බවයි.


© 2023 **Équité Sri Lanka**

# සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව

මානව හිමිකම් පිලිබඳ විශ්ව ප්‍රකාශනය ඇතුළු විවිධ ජාත්‍යන්තර ප්‍රඥප්ති සහ ගිවිසුම් තුළින්ද ප්‍රකාශ කර ඇති ආකාරයට සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව යනු පුළුල්ව පිළිගත් මූලික මානව අයිතිවාසිකමකි. කෙසේනමුත්, යතාර්ථය සැමවිටම මෙම පරමාදර්ශී තත්වය තරම් යහපත් නැති අතර, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් වැනි ආන්තිකකරණයට ලක්වූ ප්‍රජාවන්ට එය විශේෂයෙන් බලපායි. සෞඛ්‍ය සේවා ලබාගැනීමට උත්සාහ කිරීමේදී සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් ඇතුළු සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් විශේෂිත වූ සහ සැලකිය යුතු අභියෝගවලට මුහුණපායි. මෙම අනාරක්ෂිත තත්වය පැනනගින්නේ ක්‍රමානුකූල වෙනස්කොට සැලකීම, සමාජයීය මතග්‍රාහීත්වයන් සහ සෞඛ්‍ය සේවා සපයන පද්ධති තුළ ඇති අප්‍රමාණවත් අවබෝධය යන කරුණුවල එකතුවකිනි.

"මම පියයුරු ඉවත්කරන සැත්කම කරන්න ගියාම රාගම රෝහලේ වෛද්‍යවරයෙක් මගෙන් දිගින් දිගටම ප්‍රශ්න අහන්න ගත්ත. සමහර ප්‍රශ්න අනවශ්‍ය ඒව, ඒවගේම ඒව ඇහුවෙත් මහ සද්දෙන්. ඒ වාට්ටුවෙ හිටපු හැමෝම දැනගත්ත මම සංක්‍රාන්ති සමාජභාවී පිරිමියෙක් කියල. මේ නිසා වාට්ටුවෙ ඉන්න එක හරිම අපහසු දෙයක් වුනා."

- *නිසල් (අවු. 26 යි, වත්තල සිට)*

සහභාගී වූ පිරිසෙන් එකරැස් කරගත් දත්ත පෙන්වන ආකාරයට, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් සෞඛ්‍ය සේවා සපයන්නන් හමුවේ මුහුණපාන ප්‍රධානතම අභියෝගයක් වන්නේ ඔවුන් අතර ව්‍යාප්තව ඇති අප්‍රමාණවත් සංස්කෘතික නිපුණතාවයි. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට විශේෂිත වූ අවශ්‍යතා සහ අවධානය අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට අවශ්‍ය දැනුම සහ අවබෝධය බොහොමයක් සෞඛ්‍ය වෘත්තිකයින්ට නොමැත. මෙම ඌනතාවය විවිධ ආකාරවලින් දැකිය හැකි වන අතර, ඒවා සියල්ලම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ සෞඛ්‍යසේවා සම්බන්ධ අත්දැකීමට දැඩි ලෙස බලපෑ හැකිය.

"(පියයුරු ඉවත්කිරීමේ) සැත්කමක් කරගත්ත මගේ යාලුවෙක් බලන්න මම කොළඹ ජාතික රෝහලට ගියා. මහ රෑ රෝහල් සාත්තු සේවකයෙක් ඇවිත් කිව්ව එන්නතක් විදින්න තියෙනව, මට පැත්තකට වෙන්න කියල. ඒ සේවකයා අපහු ගියාම මගේ යාළුවා කිව්ව එයාව ලිංගික අතවරයකට ලක්වුනා, සහ එයාගේ ලිංගික ඉන්ද්‍රිය ඇල්ලුව කියල. මට ගොඩක් කේන්ති ගියා. මම ඉක්මනින්ම ගියා ඒ වාට්ටුව බාර වෛද්‍යවරයාව හම්බවෙලා මේ ගැන පැමිණිලි කරන්න. එයා මට කිව්වෙ සන්සුන් වෙන්න කියල සහ සිහිබුද්ධියෙන් වැඩ කරන්න කියල. ඊට අමතරව එයා කිව්වෙ තවත් ප්‍රශ්න ඇති වෙන්න පුළුවන් නිසා මේ ගැන කලබලයක් ඇති කරන්න එපා, සහ මගේ යාළුවව රෝහලෙන් නිදහස් කරනකම් මේ ගැන කලබලයක් ඇති කරන්න එපා නිශ්ශබ්දව ඉන්න කියල."

- *චමත් (අවු. 31, කොළඹ සිට)*

සහභාගී වූ පිරිසට අනුව, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සමග කටයුතු කිරීමේදී බොහෝ අවස්ථාවල සෞඛ්‍ය සේවා සපයන්නන් අසංවේදී බවක් පෙන්වයි. නුසුදුසු විහිළු හෝ ප්‍රකාශ වල සිට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් මුහුණපාන චිත්තවේගීය සහ මානසික අභියෝග පිලිබඳ අවබෝධයක් නොමැතිකමක් දක්වා මෙම තත්වය දැකිය හැකිය. මෙම අසංවේදී සහ අනුකම්පා විරහිත හැසිරීම මානසික සෞඛ්‍ය සම්බන්ධ අභියෝග වඩාත් නරක අතට හරවන අතර, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට දැඩි ලෙස



© 2023 **Équité Sri Lanka**

අවශ්‍ය රැකවරණය ලබාගැනීම අධෛර්යමත් කරයි. ප්‍රමාද වූ හෝ මගහැරුණු සෞඛ්‍යසේවා සෞඛ්‍ය තත්ත්ව නරක අතට හරවන බැවින් සහ සමස්ත යහපැවැත්ම අඩුකරන බැවින්, මෙම පසුබට වීම දරුණු ප්‍රතිඵලවලට මගපාදයි.

"පියයුරු ඉවත්කිරීමේ සැත්කමට ලියාපදිංචි වෙන්න මහ රෝහල්වල ලොකු පෝලිමක් තියෙනව. ඒ මුළු කාලයම අපි බලන් හිටියත්, මේ සැත්කම් වහාම කරන්න ඕන ඒව නෙමෙයි කියල (රෝහල් බලධාරීන්) සැත්කම් කරන්නෙ නැහැ. මගේ සැත්කම කරන්න මම තුන්පාරක් රෝහල්ගත වුනා. ඒත් ඒ හැම පාරම ප්‍රමුඛතාවය දෙන්න ඕන වෙනත් සැත්කම් තියෙනව කියල මාව ගෙදර යැව්ව. අපි අකමැති ශරීරයක් ඇතුලෙ ජීවත්වෙමින් අපි දිනපතා විඳින වේදනාව මේ වෛද්‍යවරුන්ට පෙන්නෙ නැහැ."

- *නිවන්ත (අවු. 27 යි, කඩුවෙල සිට)*

සහභාගී වූ පිරිස සඳහන් කළේ හෝමෝන ප්‍රතිකාර සහ සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ සැත්කම් ඇතුළු සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ සෞඛ්‍යසේවා රැකවරණය ලබාගැනීම විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට අභියෝගත්මක විය හැකි බවයි. ඔවුන්ගෙන් 62%ක් දැරූ මතය වූයේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සඳහා වෙන්වූ සෞඛ්‍ය සේවා සායන සහ විශේෂඥයින් මදිකමක් ශ්‍රී ලංකාවේ ඇති බවයි.

"සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව වෙන් නොකොට පිළිගන්න සෞඛ්‍ය සේවා ගැන විශේෂඥ වෛද්‍යවරුන් අපිට නැහැ. අපේ ගර්භාෂය ඉවත් කරගන්න ඕන නම් ගැහැණු අයත් එක්ක සාමාන්‍ය වාට්ටුවට ඇතුළත් වෙන්න අපිට සිද්ධවෙනව. ඒ වගේම අපිට අපේ ශරීරය ගැන තීරණයක් ගන්න ඇතිතරම් දැනුම නැහැ. වෛද්‍ය ක්‍රියාවලීන් ගැන අපිට හැමතිස්සෙම සැකසහිත ගතියක් තියෙනව, සහ අවංකවම කියනවනම් ඒ ගැන අහන්නත් කවුරුත් නැහැ."

- *සරිත් (අවු. 35 යි, මාතලේ සිට)*

රැස්කළ දත්ත පෙන්වන්නේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් මුහුණපාන ප්‍රධානතම සෞඛ්‍ය සේවා සම්බන්ධ විෂමතාවක් පදනම්ව ඇත්තේ ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධයෙන් බවයි. පිරිමි සමාජභාවී අනන්‍යතාවය නොසලකා බොහොමයක් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් ගර්භාශය සහ ඩිම්බ කෝෂ වැනි ඔවුන්ගේ ප්‍රජනන අවයව (ඉවත් නොකර) තබාගනී. එනිසා ඔවුන්ට තවමත් ඔසප් චක්‍රය ඇතිවීම සහ ගර්භනී වීම සිදුවිය හැකි අතර, ඇතැම් අවස්ථාවලදී නිසි නාරිවේදය සම්බන්ධ රැකවරණය අවශ්‍ය විය හැකිය. කෙසේනමුත්, සාම්ප්‍රදායික සෞඛ්‍ය සේවා පද්ධතීන්ට සහ සේවා සපයන්නන්ට බොහෝ අවස්ථාවලදී මෙම විශේෂිත වූ අවශ්‍යතා පිලිබඳ අවබෝධයක් නොමැති අතර, ඇතැම් අවස්ථාවලදී ඒවා නොසලකා හරී. එම නිසා, සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට නිසි නාරිවේදය සම්බන්ධ සෞඛ්‍ය රැකවරණය ලබාගැනීමට හැකියාවක් තිබීම ඉතා වැදගත්ය. ගැබ්ගෙල පිළිකා හෝ ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධ තත්වයන් වැනි ඇතිවීමට ඉඩකඩ ඇති සෞඛ්‍ය ගැටළු කලින් හඳුනාගැනීමට එවැනි සේවා අවශ්‍ය වේ. තවද, ප්‍රමාණවත් නොවන හෝ අසංවේදී ලෙස ලබාදෙන සෞඛ්‍ය රැකවරණය හේතුවෙන් ඇතිවන මානසික පීඩාව සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ව අවශ්‍ය වෛද්‍ය සහය ලබාගැනීම සම්බන්ධයෙන් ඔවුන්ව අධෛර්යමත් කරන අතර, ඔවුන්ට බලපාන සෞඛ්‍ය විෂමතා නරක අතට හරවයි.

"අපිට ලැබෙන මානසික සෞඛ්‍ය සම්බන්ධ සේවා ලැබෙන්නෙ GRC එක ලැබෙනකම් විතරයි. ඊට පස්සෙ මුකුත් නැහැ. අපි අපේ අනන්‍යතාවය දැනගෙන හිටියට අපිට මානසික සහයත් ඕන මානසික සෞඛ්‍ය හරියට


© 2023 **Équité Sri Lanka**

තියාගන්න. මම හිතනව සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට මානසික සහය ලැබීම ගොඩක් වැදගත් කියල; අඩුම තරමෙ සංක්‍රාන්ති ක්‍රියාවලිය පටන් අරගෙන අවුරුදු දෙකක්වත්."

- *ගිහාන් (අවු. 24 යි, මීගොඩ සිට)*

නිසි මානසික සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ට වැදගත් වේ. ඒ, එම සේවා වෙනස්කොට සැලකීමෙන් ඇතිවන බලපෑම විශාල ලෙස මගහරවන බැවින් සහ මානසික සෞඛ්‍ය ගැටළු සමනය කරන බැවිනි. සමීක්ෂණයට සහභාගී වූ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින්ගෙන් 58% ක් ප්‍රකාශ කළේ ඔවුන් චිත්තවේගාත්මක පීඩනය අත්දැක ඇති බවත්, එය විෂාදය, සාංකාව සහ සියදිවි නසාගැනීම පිළිබඳ සිතුවිලි ඇතිවීමට පාවාද දායක වී ඇති බවයි. කෙසේනමුත්, එවැනි සේවාවන් සොයාගැනීම අසීරු කරුණකි. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ විශේෂිත වූ අවශ්‍යතා පිළිබඳ කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව සහ සංස්කෘතික නිපුණතාවය බොහෝ සෞඛ්‍ය සේවා සපයන්නන්ට ප්‍රමාණවත් ලෙස නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මානසික සෞඛ්‍ය සේවා ලබාගැනීමේදී, සිය අත්දැකීම් පිළිබඳ නොදැනුවත් හෝ අසංවේදී සෞඛ්‍ය සේවා සපයන්නන් සමග ගනුදෙනු කිරීමට සිදුවීම වැනි අමතර අභියෝගවලට සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් මුහුණපායි.

සමීක්ෂණයට සහභාගී වූ පිරිස සඳහන් කළේ ප්‍රමාණවත් පරිදි සෞඛ්‍ය සේවා ලබාගැනීම ජීවත් වන ප්‍රදේශය අනුව විශාල ලෙස වෙනස්වන බවත්, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ වෙනස් තත්වයන් පෙන්වන බවත්ය. ඔවුන් පැවසුවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට විශේෂිත වූ අවශ්‍යතා පිළිබඳ කටයුතු කර අත්දැකීම් ඇති සහ ඊට අවශ්‍ය සම්පත් හා දැනුම ඇති සෞඛ්‍ය සේවා සපයන්නන් නාගරික ප්‍රදේශවල සිටීමට වැඩි නැඹුරුතාවක් ඇති බවයි. අනෙක් අතට, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් ඔවුන්ව වෙන් නොකොට පිළිගන්නා සෞඛ්‍ය සේවා ලබාගැනීමට උත්සාහ කිරීමේදී දැඩි අභියෝගවලට මුහුණපායි. බොහෝ අවස්ථාවල, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ සෞඛ්‍ය පිළිබඳ විශේෂඥතාවය ඇති සෞඛ්‍ය සේවා සපයන්නන් ග්‍රාමීය ප්‍රදේශවල සිටින්නේ අඩු වශයෙනි. මෙම විශේෂඥතාවයෙන් අඩු රැකවරණය හේතුවෙන් වෛද්‍ය හමුවීමක් සඳහා දීර්ඝ කාලයක් බලාහිඳීමට සිදුවීම, සීමාසහිත ප්‍රතිකාර විධි, සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් පිළිබඳ සෞඛ්‍ය සේවා මාර්ගෝපදේශ පිළිබඳ දැනුම නොමැති සෞඛ්‍ය සේවා වෘත්තිකයින් කෙරෙන් එල්ලවන වැරදි තොරතුරු මත පදනම් වූ හෝ වෙනස්කොට සලකන සුළු ආකල්ප වැනි ගැටළුද මතු වේ.

සෞඛ්‍ය සේවා විෂමතාවල වඩාත් සැලකිල්ලට ගත යුතු කරුණක් වන්නේ පුද්ගලයින්ට අවශ්‍ය සේවා ලබාගැනීමට දිගුදුරක් ගමන් කිරීමට සිදුවීමයි. මෙම තත්වය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් මත විශාල මූල්‍යමය බරක් ඇතිකළ හැකිය. මන්ද, බොහෝ අවස්ථාවලදී ඔවුන්ට ගමනාගමන වියදම් සහ නවාතැන් වියදම් දැරීමට සිදුවන අතර, වෛද්‍ය හමුවන්ට සහ සැත්කම්වලට නිවාඩු ලබාගැනීමටද සිදුවේ. තවද, දිගු දුරක් ගමන් කිරීමට සිදුවීම හේතුවෙන් සෞඛ්‍ය සම්බන්ධ රැකවරණය ප්‍රමාද වීම හෝ නිසි පරිදි ලබා නොගැනීම සිදු වේ. මෙය මානසික සහ ශාරීරික සෞඛ්‍ය මත ඍණාත්මක බලපෑමක් ඇති කරයි.

සහභාගී වූ පිරිස තවදුරටත් පැවසුවේ ඔවුන් මුහුණපාන බාධකද ප්‍රමාණවත් පරිදි සෞඛ්‍ය සේවා ලබාගැනීම වළකන බවයි. ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගෙ රැකවරණය ඉලක්ක කොටගත් රක්ෂණාවරණ සීමා සහිත විය හැකි අතර, ඇතැම් විට ප්‍රතික්ෂේප විය හැකිය. මෙම තත්වය, අවශ්‍ය ප්‍රතිකාර සහ ඖෂධ ලබාගැනීම මූල්‍යමය වශයෙන් ද අසීරු කටයුත්තක් බවට පත් කර තිබේ.


© 2023 **Équité Sri Lanka**

# නිර්දේශ

ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවගේ ජීවිත ඉහළ නැංවීමට නම්, සමාජ පිළිගැනීම, සෞඛ්‍ය සේවා, නීතිමය අයිතීන් සහ ආර්ථික අවස්ථා ඇතුළු ඔවුන්ගේ යහපැවැත්මේ විවිධ අංග සම්බන්ධයෙන් විසඳුම් සෙවිය හැකි බහුවිධ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

- නීතිමය රැකවරණය සඳහා නීතිමය පිළිගැනීම සහ අධිවාචනය වඩාත් පුළුල් කිරීම: සමාජභාවී අනන්‍යතාවය සහ SOGIESC යටත් එන අනෙකුත් අනන්‍යතා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව යටතේ පිළිගැනීම.

- දණ්ඩ නීති සංග්‍රහයේ 365, 365අ සහ 399 වගන්ති මෙන්ම පාදඩ ආඥා පනත වැනි LGBTIQ+ ප්‍රජාව වෙනස්කොට සලකන නීතිමය ප්‍රතිපාදන ඉවත් කිරීම හෝ සංශෝධනය කිරීම.

- කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් සකසමින් පවතින සමාජභාවී අනන්‍යතා සමානාත්මතා කෙටුම්පත අනුමත කිරීමට සහ බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- දූෂණය සහ ලිංගික වැරදි සම්බන්ධ සාමාන්‍ය නීතිය යටතේ පිරිමි පුද්ගලයින් ලක්වන දූෂණය සහ කැමැත්තෙන් තොරව සිදුවන ලිංගික ක්‍රියා හඳුනාගැනීම.

- විවිධ සමාජභාවී අනන්‍යතා, ප්‍රකාශන සහ ලිංගික දිශානතීන් පිළිබඳ මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් පුළුල් කරමින් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව මුහුණපාන විශේෂ අභියෝග සහ ගැටළු පිලිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඊට අදාළ අධ්‍යාපනය ලබාදීම.

- ශ්‍රී ලංකාවේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාව වෙනුවෙන් සහය ලබාදෙන කණ්ඩායම් සහ ඊට අදාළ අවකාශය ඇති කිරීම.

- සංක්‍රාන්ති සමාජභාවී පිරිමි ප්‍රජාවට අනෙකුත් අය සමග සම්බන්ධවීමට අවස්ථාව ලබාදෙන වේදිකා ඇතිකිරීම.

- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව වෙන් නොකොට පිළිගන්නා සෞඛ්‍යසේවා ලබාදීම පිලිබඳව සෞඛ්‍ය අංශය තුළ වෘත්තීමය විශේෂඥතාවය ඇතිකිරීම. මෙහිදී මානසික සෞඛ්‍ය සහ පශ්චාත්-සැත්කම් සාත්තු සේවය සම්බන්ධ සේවා පුළුල් කිරීම වඩාත් වැදගත් වේ.

- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට සමාජභාවී අනන්‍යතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියේදී සහය ලබාදීමට ඔවුන් වෙනුවෙන්ම වෙන්වූ සේවා ස්ථාන පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම.

- අධ්‍යාපනඥයින් සහ සේවා සපයන්නන් පුහුණු කිරීම අරමුණු කොටගත්, වෙන් නොකොට පිළිගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති සහ ප්‍රවේශ හඳුන්වාදීම හරහා අධ්‍යාපන අංශය තුළ SOGIESC පිළිබඳ දැනුවත්භාවය වැඩිකිරීම.


© 2023 **Équité Sri Lanka**

- සේවා ලබාගැනීමේදී අපහසුතා ඇතිවීම සහ හිරිහැර සිදුවීම වැළැක්වීමට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ ලියකියවිලි වෙනස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ සේවා පිලිබඳව රාජ්‍ය සේවකයින්ට ප්‍රමාණවත් දැනුමක් ලබාදීම.

- වෙන් නොකොට පිළිගැනීම සම්බන්ධ භාෂා සහ වචන භාවිතය පිලිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම. මෙහිදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සමග සම්බන්ධ වීමට සේවා සපයන්නන්ට අවශ්‍ය භාෂා දැනුම විශේෂ වේ.

- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට ආරක්ෂිත සහ වෙන් නොකොට පිළිගන්නා පරිසරයක් තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල විවිධත්ව සහ පිළිගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති ඇතිකිරීම.

- ILO සංවිධානයේ C190 සම්මුතිය අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් ඉලක්ක කරගත් යටිතල පහසුකම් ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම. මෙහිදී සනීපාරක්ෂක පහසුකම් විශේෂයෙන්ම අවධානයට ලක්විය යුතුය.

- සංක්‍රාන්ති සමාජභාවීය පුරුෂ ප්‍රජාව වෙනුවෙන්ම ආරක්ෂිත ස්ථානයක්, තාවකාලික රැකවරණ මධ්‍යස්ථානයක්, ගොඩවැදීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.

- සමාජයේ පවතින සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවට එරෙහිව පියවර ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණ ඇතිකිරීම.



© 2023 **Équité Sri Lanka**